# වාර්ෂික වාර්තාව

# 2015

## ජාතික මෝස්තර මධ්‍යස්ථානය

# උගත් පාඩම් සහ හොඳම පරිචයන්

''අතීතය දෙස විමසීම් සහගතව බැලීම කිසිසේත්ම කාලය අපතේ යැවීමක් නොවේ.

සාර්ථකත්වය හා අනාගත වර්ධනය වෙනුවෙන් පූර්ව ක්‍රියාමාර්ග සහ ලැබූ අත්දැකීම් පිළිබඳව අවබෝධයක් තිබීම ඉතාම වැදගත් වේ. එවැනි පසු විපරමක් කිරීම තුල උගත් පාඩම් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත් ගුණාත්මක ප්‍රතිඵල පෙන්වූ හොඳම ක්‍රියාමාර්ගයන් හඳුනා ගැනීමටත් අවස්ථාව ලැබේ.

අවදානම් හඳුනාගැනීම සඳහා මෙන්ම අවම කරගැනීමේ ක්‍රියාවලිය සඳහා වඩාත් පහසුකම් සලසමින්, අපගේ ශක්තීන් හඳුනාගනිමින් සහ ඉහළ නංවමින් සහ ඵලදායීතාවය වර්ධනය කරමින් සේවාදායකයා වන හස්ත කර්මාන්ත ශිල්පියාට වඩාත් ඵලදායී නිර්මාණ විසඳුම් රැගෙන එන්නෙමු.

# අන්තර්ගතය

මග පෙන්වන මුලධර්ම - 1

- දැක්ම
- මෙහෙවර

ආයතනික අරමුණු හා හර වටිනාකම් - 2

ආයතන පනත හා ලියාපදිංචිය - 3

ආයතන කලමනාකාරිත්වය - 4

ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය - 5

සභාපතිගේ පණිවුඩය - 6

අධ්‍යක්ෂගේ පණිවුඩය - 7

ආයතන ව්‍යුහය -8

මානව සම්පත 9 - 12

මූල්‍ය කාර්ය සාධනය - 13 - 14

සංවර්ධන ක්‍රියාකාරකම් 15 - 29

2015 වසරේ නිෂ්පාදිත නව හස්ත කර්මාන්ත නිමැවුම් කිහිපයක් 31 - 36

2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අවසාන ගිණුම් 37 - 59

2015 ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව 60 - 69

# <u>මග පෙන්වන මූලධර්ම</u>

**<u>දැක්ම</u>** :-

නිර්මාණ සංවර්ධනය හා
නව නිර්මාණාත්මක මෝස්තර හඳුන්වාදීම තුලින්
හස්තකර්මාන්ත ක්ෂේත්‍රය
වඩාත් සක්‍රිය
ආර්ථික ක්ෂේත්‍රයක් බවට පත් කිරීම.

**<u>මෙහෙවර</u>** :-

ප්‍රවර්ධනය, සංවර්ධනය,
හැකියාවන් ගොඩනැංවීම,
ප්‍රචලිත කිරීම සහ
ප්‍රධාන ප්‍රවාහයට අනුගත කිරීම තුලින්
වෙළඳපොල පාදක කරගත්
නිර්මාණාත්මක මෝස්තර හඳුන්වාදීම.

## ආයතනික අරමුණු:-

- හස්ත කර්මාන්ත ශිල්පීන් විසින් දැනට නිෂ්පාදනය කරනු ලබන අත්කම් භාණ්ඩ සංවර්ධනය කිරීම සහ දේශීය මෙන්ම අපනයන වෙළඳපළෙහි වර්තමාන සහ අනාගත වෙළඳපල නැම්යාවන්ට අනුව නව නිර්මාණ හදුන්වා දීම.

- නිෂ්පාදන ධාරිතාව වැඩිකර ගැනීම සහ උසස් නිමාවකින් යුතු අත්කම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම අරමුණු කරගෙන නිසි තාක්ෂණික ක්‍රම හා අමුද්‍රව්‍ය පිළියෙල කරගැනීමේ ක්‍රම හදුන්වා දීම.

- ආදායම් වැඩිකර ගැනීම තුළින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ වඩාත් යහපත් වර්ධනයක් අරමුණු කරගෙන ශිල්පීන්ට උසස් ශිල්පීය, තාක්ෂණික හා මෝස්තර සංවර්ධන පුහුණු සහාය ලබාදීම.

- හස්ත කර්මාන්ත ශිල්පීන්ට නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමට පහසුකම් සැලසීම සහ පොදු පහසුකම් සැලසීම සඳහා පොදු පහසුකම් සේවාවන් ලබාදීම.

- හස්තකර්මාන්ත නිර්මාණ සඳහා වඩාත් කාර්යක්ෂම, නව්‍ය නිෂ්පාදන ක්‍රමවේද හදුන්වාදීම.

- ප්‍රකාශන, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුස්තකාල පහසුකම් සැපයීම මගින් හස්ත කර්මාන්ත ශිල්පීන්ට, අලෙවිකරුවන්ට සහ හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට සම්බන්ධ වී සිටින්නන්ට අවශ්‍ය තොරතුරු ලබාදීම.

- රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් වලට අනුව මෝස්තර උපදේශක සේවාවන් ලබාදීම.

- මෝස්තර නිර්මාණාත්මක හැකියාවන් වර්ධනය කිරීම සහ වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම.

## (Core Values) හර වටිනාකම්

- ✓ **අප වගකීමෙන් බැදී සිටිමු**
- ✓ **අවංක හා විනිවිදභාවයෙන් යුතු වෙමු**
- ✓ **නිපුනත්වය හා එකමුතු ප්‍රයත්නයන් විශ්වාස කරමු**
- ✓ **නව තාක්ෂණය හා අභිරුචිය භාවිතා කිරීමට පෙළඹෙමු**
- ✓ **හොද පාරිභෝගික සේවාවක් ලබා දෙන බවට විශ්වාස කරමු**

## ආයතන පනත හා ලියාපදිංචිය

1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා හා අනුබද්ධ ආයතන පනත යටතේ 1983 වර්ෂයේදී ආරම්භ කරන ලද ජාතික මෝස්තර මධ්‍යස්ථානය දේශීය හස්ත කර්මාන්තයේ උන්නතිය උදෙසා හස්තකර්මාන්ත ශිල්පීන් සම්ප්‍රදායෙන් ඔබ්බට ගෙන යමින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය මූලික කරගෙන පිහිටුවනු ලැබූ සේවා සපයන රාජ්‍ය ආයතනයක් වන අතර මේ වන විට සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

## සංවිධානය

**ජාතික මෝස්තර මධ්‍යස්ථානය** සමස්ත හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් සිය අරමුනු ඉටු කරගැනිමට නිරතුරුව ක්‍රියාත්මක වී සිටී. මෙහිදී මොරටුව, කටුබැද්ද, ද මැල් පාරේ අංක 10 දරණ ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ මූලිකත්වයෙන් හා මධ්‍යම පලාත ආවරණය කරමින් මහනුවර, කලාපුරය, නත්තරම්පොත පිහිටුවා ඇති ශාඛා කාර්යාලයේ සහයෝගයෙන් විවිධ ක්‍රියාකාරක්ම් ක්‍රියාත්මක කරමින් හස්තකර්මාන්ත ශිල්පියා නඟා සිටුවීමට කැපවී සිටී.

මීට අමතරව, ඩිප්ලෝමා පාඨමාලා හරහා නව නිර්මාණකරුවන් බිහි කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරන ජාතික පිරිනිර්මාණ විද්‍යාලය ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති අතර ඒ හරහා නිර්මාණශීලි හැකියාවක් ඇති තරුණ තරුණියන්ට ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තර තලය දක්වා වෘත්තීය දැනුමක් ලබා ගැනීමේ අවස්ථාව ලබාදී ඇත.

එමෙන්ම, නත්තරම්පොත ශාඛා කාර්යාලය තුල ස්ථාපිත පිත්තල, ලාක්ෂා, හා සම් ආශ්‍රිත වැඩහල හා පොදු පහසුකම් මධ්‍යස්ථානය මගින් හස්තකර්මාන්ත ශිල්පියාට අඛණ්ඩ සේවාවක් සපයයි.

ජාතික මෝස්තර මධ්‍යස්ථානය සිය දැක්ම ප්‍රධාන කොට ක්‍රියාත්මක මෙහෙවර තුලින් තම අරමුණු ඉටු කිරීමේදි ප්‍රධාන කාර්යාලයේ මූලිකත්වය ඇතිව හා නත්තරම්පොත පිහිටි ශාඛා කාර්යාලයේ සහයෝගය ඇතිව ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාල කාර්යයන් ක්‍රියාත්මක කෙරේ. මීට අමතරව සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ මඟපෙන්වීමත්, පවතින අනෙකුත් සහෝදර ආයතන මෙන්ම පළාත් සභා හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට අදාල විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් හි නියැලෙන ස්වෙච්ඡා සංවිධාන, හස්ත කර්මාන්තකරුවෝ සහ වෙනත් බාහිර ආයතන ඉහත දැක්වෙන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා නිරතුරුව සම්බන්ධ වේ.

සියළුම පරිපාලන, මූල්‍ය, අලෙවි ප්‍රවර්ධන කටයුතු, මෝස්තර සංවර්ධන, මෝස්තර අධ්‍යාපන, තාක්ෂණික සංවර්ධන මෙන්ම පර්යේෂණ හා සංවර්ධන යන ක්ෂේත්‍රයට අදාල කාර්යයන් ද පොදු පහසුකම් හා පුස්තකාල සේවා සැපයීම ආදි ආයතනයේ ප්‍රධාන අරමුණු ඉටුකිරීමට අදාල සියළුම කාර්යයන් ප්‍රධාන කාර්යාලය මගින් සිදුකරන අතර පරිපාලන, මූල්‍ය සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු හැර අනෙකුත් සියළු කටයුතු නත්තරම්පොත ව්‍යාපෘති කාර්යාලය මගින් ද ඉටු කෙරේ.

| | | | |
|---|---|---|---|
| (i) | ප්‍රධාන කාර්යාලය | - | අංක 10, ද මෙල් පාර, කටුබැද්ද, මොරටුව. |
| | දුරකථන/ෆැක්ස් අංක | - | 011-2607114 - සභාපති |
| | | | 011-2626345 - අධ්‍යක්‍ෂ |
| | | | 011-2607814 - පොදු |
| | ෆැක්ස් | | 011-2607111 |
| | ඊ-මේල් | | slndcrisep@yahoo.com / info@slndc.gov.lk |
| (ii) | නත්තරම්පොත පොදු පහසුකම් මධ්‍යස්ථානය සහ වැඩහල | - | කලාපුරය, නත්තරම්පොත. |
| | දුරකථන අංකය / ෆැක්ස් | - | 081-2420038 |

# ආයතනික කළමණාකාරිත්වය

## අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| සුනිල් ගුණවර්ධන මහතා | - සභාපති (2015.05.06 සිට) |
| කේ. එම්. තවුෆීක් මහතා | - සභාපති (2015.12.15 සිට) |
| ජී. ඊ. වැන්ගයිල් මහත්මිය | - සාමාජික (2015.05.18 සිට) |
| මහාචාර්ය සුසිරිපාල මාලින්බොඩ | - සාමාජික |
| ආචාර්ය ප්‍රසන්න ලියනගේ මහතා | - සාමාජික (2015.05.18 සිට) |
| ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා | - සාමාජික (2015.05.18 සිට) |
| චිත්‍රාන්ජලී දිසානායක මෙනවිය | - සාමාජික (2015.06.11 සිට) |
| කෝකිලා ද අල්විස් මහත්මිය | - සාමාජික/භාණ්ඩාගාර නියෝජිත 2015.06.16 - 2015.11.01 |
| ඩබ්. කේ. ඩී. ඩන්ස්ටන් මහත්මිය | - සාමාජික/භාණ්ඩාගාර නියෝජිත 2015.11.02 සිට |
| බුද්ධි කීර්තිසේන මහතා | - සාමාජික |
| සුජාතා වීරකෝන් මහත්මිය | - සාමාජික |
| හසිත තිලකරත්න මහතා | - සාමාජික |

## ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය

| | |
|---|---|
| සුනිල් ගුණවර්ධන මහතා | - සභාපති - ජාතික මෝස්තර මධ්‍යස්ථානය |
| කේ. එම්. තවුෆීක් මහතා | - සභාපති - ජාතික මෝස්තර මධ්‍යස්ථානය |
| එම්. ඒ. එස්. එස්. කේ. චන්ද්‍රසිරි මහතා | - අධ්‍යක්ෂ - ජාතික මෝස්තර මධ්‍යස්ථානය. |
| ඒ. ඩී. ද සිල්වා මහතා | - නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (මෝස්තර) ජාතික මෝස්තර මධ්‍යස්ථානය. කොන්ත්‍රාත් පදනම මත 01-07-2014 සිට |
| ජේ. ඒ. ඩබ්. ජයමිණි මහත්මිය | - නියෝජ්‍ය/සහකාර අධ්‍යක්‍ෂ (පාලන) ජාතික මෝස්තර මධ්‍යස්ථානය. කොන්ත්‍රාත් පදනම මත 01-08-2014 සිට |
| ජේ. ඒ. ඒ. ආර්. සී. ගුණරත්න මහතා | - සහකාර අධ්‍යක්ෂ - පර්යේෂණ (යාන්ත්‍රික) |
| ඒ. ඒ. ගාමිණී මහතා | - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර අධ්‍යාපන හා පුහුණු) |
| පී. කේ. විජේසිංහ මහතා | - සහකාර අධ්‍යක්ෂ (නත්තරම්පොත) |
| බී. ආර්. රණවීර මහත්මිය | -ගණකාධිකාරි- ජාතික මෝස්තර මධ්‍යස්ථානය |

| **බැංකුකරුවෝ** | **විගණනය** |
|---|---|
| ලංකා බැංකුව කටුබැද්ද | රජයේ විගණකාධිපති |
| මහජන බැංකුව කටුබැද්ද | විගණකාධිපති දෙපාර්තමේන්තුව |

**<u>සභාපතිගේ පණිවිඩය</u>**

ජාතික මෝස්තර මධ්‍යස්ථානය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින දිවයින පුරා විසිරී සිටින ග්‍රාමීය හස්ත කර්මාන්තකරුවන්ට දේශීය අමුද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් නව නිර්මාණ නිපදවීම සහ එළි දැක්වීම සඳහා පුහුණු වැඩ සටහන් මගින් දායකත්වය සපයන එකම රාජ්‍ය ආයතනය වේ.

ආයතනයේ මෙම ප්‍රමුඛ කාර්ය භාරය ඉටු කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති මෝස්තර සම්පාදක නිළධාරීන් සහ පුහුණු ශිල්ප උපදේශක කාර්ය මණ්ඩලයක් සිටී.

ආයතනයේ සේවාවන් පුළුල් කරමින් UNDP හා OXFAM ව්‍යාපෘති හරහා උතුරු නැගෙනහිර අවතැන්වූවන් හට 2015 වසර තුල පුහුණු වැඩ සටහන් පවත්වමින් ඔවුන්ගේ ජීවන තත්වය නංවාලීමට කටයුතු කළ හැකිවීම අප ලද සුවිශේෂී කාර්යයකි.

2015 වසර සඳහා ආයතනය විසින් නිර්මාණය කරන ලද නව නිර්මාණ රැගත් නව නිර්මාණ ප්‍රදර්ශනය මෙම වසර තුල මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් (Kandy City Centre) ප්‍රදර්ශන ශාලාවේ පැවැත්වීමට කටයුතු කරන ලද බව දන්වන්නේ සතුටිනි.

මෙම කටයුතු සාර්ථකව ඉටු කර ගැනීමට ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශයේ නිළධාරීන් සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු ආයතනයේ සියළුම කාර්ය මණ්ඩලය මා වෙත දක්වන ලද සහයෝගය කෘතඥතාපූර්වකව සිහිපත් කරමි.

**සභාපති**
**ජාතික මෝස්තර මධ්‍යස්ථානය**

## අධ්‍යක්ෂගේ පණිවිඩය

2015 වර්ෂයේ ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ කාර්ය සාධනය සමාලෝචනය කිරීම සඳහා වාර්ෂික වාර්තාවට පණිවිඩයක් ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මා බෙහෙවින් සතුටු වෙමි.

දේශීය අමුද්‍රව්‍ය උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින හස්ත කර්මාන්ත ශිල්පීන්ට නව මෝස්තර හා තාක්ෂණය ලබා දීමෙන් හස්ත කර්මාන්තකරුවාගේ ජීවන තත්වය ඉහළ නැංවීම ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ මූලික අරමුණ වේ.


දේශීය මෙන්ම විදේශීය වෙළඳපොලට ගැලපෙන පරිදි නව මෝස්තර නිර්මාණය කිරීම ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ මෝස්තර සම්පාදක නිළධාරීන් ඇතුළු වැඩහල ශිල්ප උපදේශක කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලබයි.

සෑම වසරකම අවසානයේ නව නිර්මාණ එළිදැක්වීම සඳහා යුගයට නිමැවුම් නමින් ප්‍රදර්ශනයක් පළාත් මට්ටමින් පවත්වනු ලබයි. ඒ සඳහා දිවයින පුරා විසිරී සිටින හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ නිර්මාණ ඉදිරිපත් කෙරේ. ප්‍රදර්ශනය නැරඹීම සඳහා දේශීය මෙන්ම විදේශිකයන් බොහෝ පිරිසක් පැමිණෙන අතර ජාතික මෝස්තර මධ්‍යස්ථානය මගින් එළි දක්වන නව නිර්මාණ දේශීය හා විදේශීය වෙළඳපොලට හඳුන්වාදීම මෙහි මූලික අරමුණයි

මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නායකත්වය සහ ප්‍රතිපාදන ලබාදීම සඳහා කටයුතු කළ අප රේඛීය අමාත්‍යාංශය වන කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා, නියෝජ්‍ය අමාත්‍ය ගරු චම්පික ප්‍රේමදාස මැතිතුමා සහ ලේකම් ටී. බී. තෙන්නකෝන් මහතා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තූතිය මෙයින් පළ කර සිටිමි.

**එම්. ඒ. එස්. එස්. කේ. චන්ද්‍රසිරි**
**අධ්‍යක්ෂ**
**ජාතික මෝස්තර මධ්‍යස්ථානය**

# ආයතන ව්‍යුහය


සභාපති
අධ්‍යක්ෂ
HM 1-3
MM 1-1
නි. අ/ ස. අ. (පරිපාලන)
නි. අ. (මෝස්තර සංවර්ධන)
නි. අ. (මෝස්තර අධ්‍යාපන හා පුහුණු)
MM 1-1
ගණකාධිකාරී
ස. අ. (මෝස්තර සංවර්ධන)
ස. අ. පර්යේෂණ (රසායනික)
ස. අ. පර්යේෂණ (අලෙවි)
ස. අ. පර්යේෂණ (යාන්ත්‍රික)
අභ්‍යන්තර විගණන නිලධාරී
JM 1-1 ....
පරිපාලන නිලධාරී
ගිණුම් නිලධාරී
ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක
වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී
MA 5-1
මෝස්තර සම්පාදක
MA 3
සංවර්ධන සහකාර
සංවර්ධන සහකාර
අලෙවි සහකාර
පුස්තකාල/තොරතුරු සහකාර
සංවර්ධන සහකාර
MA 2-1
පෞද්ගලික සහකාර
පෞද්ගලික සහකාර
MM 1-1
කළමණාකරන සහකාර 10
කළමණාකරන සහකාර
ශිල්ප උපදේශක 32
කළමණාකරන සහකාර
කළමණාකරන සහකාර
කළමණාකරන සහකාර
PL 3 ....
රියැදුරු 06
PL 1 ....
කාර්යාල සහායක 17
මුරකරු 04

# මානව සම්පත්

| තනතුරු නාමය | සේවා ගණය | අනුමත | පවතින | පුරප්පාඩු | අධීක්ෂණ නිළධාරි |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | HM 1-3 | 01 | 01 | - | සභාපති |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන හා පර්යේෂණ | MM 1-1 | 01 | 01 (කොන්ත්‍රාත්) | | අධ්‍යක්ෂ |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර අධ්‍යාපන හා පුහුණු) | MM 1-1 | 01 | - | 01 | අධ්‍යක්ෂ |
| සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | MM 1-1 | 01 | 01 (කොන්ත්‍රාත්) | | අධ්‍යක්ෂ |
| සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) | MM 1-1 | 01 | - | 01 | |
| සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා යාන්ත්‍රික) | MM 1-1 | 01 | 01 | - | අධ්‍යක්ෂ |
| සහකාර අධ්‍යක්ෂ (අලෙවි) | MM 1-1 | 01 | - | 01 | අධ්‍යක්ෂ |
| සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා රසායනික) | MM 1-1 | 01 | - | 01 | අධ්‍යක්ෂ |
| ගණකාධිකාරි | MM 1-1 | 01 | 01 | - | අධ්‍යක්ෂ |
| පරිපාලන නිළධාරි | JM 1-1 | 01 | 01 | - | |
| ගිණුම් නිළධාරි | JM 1-1 | 01 | 01 | - | |
| විගණන නිළධාරි | JM 1-1 | 01 | - | 01 | |
| ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක | JM 1-1 | 04 | 05 | - | |
| මෝස්තර සම්පාදක | MA 5-1 | 09 | 09 | | |
| වැඩසටහන් සම්බන්ධීකාරක | MA 5-1 | 01 | - | 01 | |
| අලෙවි සහකාර | MA 3 | 01 | - | 01 | |
| පුස්තකාල හා තොරතුරු සහකාර | MA 3 | 01 | - | 01 | |
| සංවර්ධන සහකාර | MA 3 | 03 | 02 | 01 | |
| පෞද්ගලික සහකාර | MA 2-1 | 02 | 02 | - | |
| කළමණාකරණ සහකාර | MA 1-1 | 10 | 14 | අතිරික්ත 4 | |
| ශිල්ප උපදේශක | MA 1-1 | 32 | 20 | 12 | |
| පුහුණු සහායක | PL 1-1 | 01 | 01 | - | |
| රියැදුරු | PL 3 | 06 | 06 | - | |
| කාර්යාල සහායක | PL 1-1 | 17 | 09 | 08 | |
| මුරකරු | PL 1-1 | 04 | 07 | අතිරික්ත 3 | |
| **පෞද්ගලික වන සේ** | | | | | |
| සහකාර අධ්‍යක්ෂ (නත්තරම්පොත) | JM 1-1 | | 01 | | |
| සහකාර අධ්‍යක්ෂ (මෝස්තර අධ්‍යාපන හා පුහුණු) | JM 1-1 | | 01 | | |
| පුහුණු සහායක | PL - 1 | | 01 | | |

## උපදේශකත්වය හා සමස්ත අධීක්ෂණය

| සභාපති | | |
|---|---|---|
| තනතුර | අනුමත | පවතින |
| අධ්‍යක්ෂ | **01** | **01** |

## මෙහෙයවීම

| තනතුර | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන හා පර්යේෂණ) | 02 | 01 (කොන්ත්‍රාත්) | |
| සහකාර අධ්‍යක්ෂ (මෝස්තර අධ්‍යාපන හා පුහුණු) | | 01 | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ(පාලන) | 01 | 01 (කොන්ත්‍රාත්) | |
| සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා යාන්ත්‍රික) | 01 | 01 | -- |
| සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) | 01 | -- | 01 |
| සහකාර අධ්‍යක්ෂ (අලෙවි) | 01 | -- | 01 |
| සහකාර අධ්‍යක්ෂ(පර්යේෂණ හා රසායනික) | 01 | -- | 01 |
| ගණකාධිකාරි | 01 | 01 | -- |




## සංවර්ධන ක්‍රියාවලියට සෘජුව සම්බන්ධ වූවෝ

| තනතුර | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන හා පර්යේෂණ) | 01 | 01 (කොන්ත්‍රාත්) | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර අධ්‍යාපන හා සංවර්ධන) | 01 | 01 (කොන්ත්‍රාත්) | 01 |
| සහකාර අධ්‍යක්ෂ (අලෙවි) | 01 | -- | 01 |
| ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක | 04 | 05 | |
| මෝස්තර සම්පාදක | 09 | 08 | 01 (කොන්ත්‍රාත්) |
| අලෙවි සහකාර | 01 | -- | 01 |
| ශිල්ප උපදේශක | 32 | 20 | 12 |
| පුහුණු සහායක | -- | 03 | |

## සංවර්ධන ක්‍රියාවලියට වක්‍රව සම්බන්ධ වූවෝ

| තනතුර | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා යාන්ත්‍රික) | 01 | 01 | -- |
| සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා රසායනික) | 01 | - | 01 |
| සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | 01 | 01 | - |
| ගණකාධිකාරී | 01 | 01 | -- |
| පරිපාලන නිලධාරී | 01 | 01 | -- |
| අභ්‍යන්තර විගණක | 01 | -- | 01 |
| ගිණුම් නිලධාරී | 01 | 01 | -- |
| වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී | 01 | -- | 01 |
| සංවර්ධන සහකාර | 03 | 02 | 01 |
| පුස්තකාල/තොරතුරු සහකාර | 01 | -- | 01 |
| පෞද්ගලික සහකාර | 02 | 02 | -- |
| කළමණාකරන සහකාර | 10 | 13 | -- |
| රියැදුරු | 06 | 04 | 02 |
| කාර්යාල සහායක | 17 | 09 | 08 |
| මුරකරු | 04 | 07 | -- |

# සංවිධාන ධූරාවලිය



සභාපති
අලෙවි තොරතුරු අංශය
සහකාර අධ්‍යක්ෂ - (අලෙවි) වැ.බ.
අලෙවි සහකාර
කළමණාකරන සහකාර
පුස්තකාලය
පුස්තකාල සහකාර
පරිපාලන අංශය
නි. අ / ස. අ (පරිපාලන)
පරිපාලන නිලධාරී
පෞද්ගලික සහකාර
කළමණාකරන සහකාර
රියැදුරු
කාර්යාල සහායක
මුරකරු
ගිණුම් අංශය
ගණකාධිකාරි
ගිණුම් නිලධාරී
කළමණාකරන සහකාර
නත්තරම්පොත ශාඛා කාර්යාලය
ස. අ.(නත්තරම්පොත)
ජෝ. මෝස්තර සම්පාදක
මෝස්තර සම්පාදක
කළමණාකරණ සහකාර
ශිල්ප උපදේශක
රියැදුරු
කාර්යාල සහායක
මුරකරු
මෝස්තර අධ්‍යාපන හා පුහුණු අංශය
සහකාර අධ්‍යක්ෂ (මෝස්තර අධ්‍යාපන හා පුහුණු)
වැඩහල
සහකාර අධ්‍යක්ෂ - පර්යේෂණ (යාන්ත්‍රික)
ශිල්ප උපදේශක
පුහුණු සහායක
මෝස්තර සංවර්ධන අංශය
නි. අ. (මෝස්තර සංවර්ධන)
ස.අධ්‍යක්ෂ - පර්යේෂණ හා (රසායනික
ස. අධ්‍යක්ෂ (මෝ. සංවර්ධන)
ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක
මෝස්තර සම්පාදක
සංවර්ධන සහකාර
කළමණාකරන සහකාර

## මූල්‍ය කාර්ය සාධනය


මූලික වශයෙන් සේවා සපයන ආයතනයක් ලෙස ක්‍රියා කරන ජාතික මෝස්තර මධ්‍යස්ථානය, රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩල යටතට ගැනෙන අතර ඊට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය වෙතින් සපයා ගනු ලබයි.

2015 වසරේ අනුමත අයවැය සහ භාණ්ඩාගාරය වෙතින් ලැබු ප්‍රාග්ධන හා පුනරාවර්ථන ප්‍රතිපාදන පිළිබඳ දත්ත හා තොරතුරු පහත දැක්වේ.

## ප්‍රාග්ධන ප්‍රතිපාදන




## පුනරාවර්තන ප්‍රතිපාදන



ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් ඉටු කරනු ලබන සේවා අතර උපදේශන සේවාව විශේෂ ස්ථානයක් ගනු ලබන අතර උපදේශන සේවා සඳහා අයකරන ගාස්තු, මෙන්ම පිරිනිර්මාණ ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා අය කෙරෙන ගාස්තු මඟින් ද රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන අනුග්‍රහයෙන් සිදුකරනු ලබන නව නිර්මාණ සංවර්ධන හා පුහුණු වැඩසටහන් මෙන්ම ව්‍යාපෘති සඳහා ලැබෙන ප්‍රතිපාදන ද ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ අරමුදලට එක් වන අතර ඒ අනුව මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන අරමුදල් පහත පරිදි වේ.


1. ජාතික මෝස්තර මධ්‍යස්ථාන ගිණුම (NDC)
2. සේවක ණය අරමුදල (SLF)
3. මෝස්තර උපදේශක සේවා අරමුදල (DCF)
4. මෝස්තර අධ්‍යාපන හා පුහුණු අරමුදල (DET)

# <u>සංවර්ධන ක්‍රියාකාරකම්-2015</u>

## 01. <u>නව නිර්මාණ සැලසුම් කිරීම සහ සංවර්ධන</u>

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්ය භාරය වන දේශීය මෙන්ම විදේශීය වෙළඳපලට ගැලපෙන නව නිර්මාණ සැලසුම් කර හස්තකර්මාන්ත ශිල්පීන්ට හදුන්වාදීම යටතේ ජා.මෝ.ම. වැඩහල් තුල සංවර්ධනය කිරීම සඳහා හා හස්තකර්මාන්ත ශිල්පීන්ගේ ඉල්ලීම මත නව නිර්මාණ සැලසුම් කිරීම මෝස්තර අංශය විසින් පහත ආකාරයට ඉටු කර ඇත.

මෙම වර්ෂය තුල නව නිර්මාණ 650ක් සැලසුම් කිරීමට ඉලක්ක කර තිබූ අතර, ප්‍රධාන කාර්යාලයේ මෝස්තර අංශයෙන් හා නත්තරම්පොත ශාඛා කාර්යාලයෙන් නව නිර්මාණ සැලසුම් 837ක් සපුරා ගෙන ඇත. ජා.මෝ.ම. වැඩහල තුල නව නිර්මාණ මූලාදර්ශ බවට පත් කිරීම සඳහා එයින් නව නිර්මාණ 551ක් හදුන්වාදී ඇති අතර, ඉතිරි නව නිර්මාණ 286ක් පිටත ශිල්පීන්ගේ ඉල්ලීම මත සෘජුව ඔවුන්ට හදුන්වාදීමට කටයුතු කර ඇත.




ඊට අමතරව, උපදේශන සේවා යටතේ හා පිටත ආයතන වල ඉල්ලීම මත ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර අලංකරණ නිර්මාණ 40ක් සිදු කිරීමට ඉලක්ක කර තිබූ අතර, 52ක් නිර්මාණ සැලසුම් කිරීමට මෝස්තර අංශය කටයුතු කර ඇත.

**පිටත ආයතන වෙත ලබාදීම සඳහා සිදු කළ ග්‍රැෆික් නිර්මාණ - 2015**

| **නිර්මාණ ලබාගත් ආයතනය/පුද්ගලයා** | **නිර්මාණයේ ස්භාවය** | **නිර්මාණ සංඛ්‍යාව** |
|---|---|---|
| ක්‍රීඩා අමාත්‍යාංශය | ක්‍රීඩා කෞතුකාගාරය සඳහා ලාංඡන | 02 |
| කිතුල් සංවර්ධන මණ්ඩලය | | 02 |
| ලක්හඬ -ගුවන්විදුලිය | ලාංඡන නිර්මාණ | 04 |
| විද්‍යාතා ආයතනයට සම්බන්ධ නිෂ්පාදකයෙක් සඳහා | තෙල් නිෂ්පාදන ලේබල නිර්මාණ | 01 |
| කාලීන හසර සඟරාව | මුල හා අග පිටු නිර්මාණය | 02 |

| | | |
|---|---|---|
| කුමාරි ධර්මජයන්ති | ලාංඡන නිර්මාණ | 01 |
| අමර ග්‍රැෆික් | දැව හා පිත්තල සම්මාන නිර්මාණ | 04 |
| මානව සම්පත් කලමනාකරන ආයතනය | ගෘහ අභ්‍යන්තර අලංකරණ නිර්මාණ | 05 |
| මොරටුව විශ්ව විද්‍යාලය | ග්‍රැෆික් නිර්මාණ | 03 |
| සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | ප්‍රතිභා 2015 සම්මාන ආකෘති නිර්මාණ | 12 |
| ශ්‍රී ලංකා හස්තකර්මාන්ත ආයතනය | ඩිජිටල් බැනර් නිර්මාණ | 03 |
| සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | සාහිත්‍ය කලා ප්‍රසාදිනී සම්මාන නිර්මාන | 02 |
| මඩකලපුව ප්‍රදේශයේ හස්තකර්මාන්ත ශිල්පීන් සඳහා | ටී ෂර්ට් නිර්මාණ | 05 |
| කලර් ක්‍රාෆ්ට් ආයතනය | බෑග් නිර්මාණ | 06 |
| | **ග්‍රැෆික් නිර්මාණ** | **52** |


**2. නව නිර්මාණ මූලාදර්ශ බවට පරිවර්ථනය කිරීම.**

ජා.මෝ.ම. වැඩහල් තුල නව නිර්මාණ මූලාදර්ශ බවට පරිවර්ථනය කිරීම.

| | | |
|---|---|---|
| නව නිර්මාණ මූලාදර්ශ බවට පරිවර්ථනය කිරීම - | ඉලක්කය | -390 |
| | සපුරා ගැනිම | -435 |

මෙහිදී මොරටුව ජා.මෝ.ම. වැඩහල තුල නව නිර්මාණ 288ක් මූලාදර්ශ බවට පත් කර ඇති අතර, නත්තරම්පොත ජා.මෝ.ම. වැඩහල තුල නව නිර්මාණ 167ක් මූලාදර්ශ බවට පත් කිරීමට කටයුතු කර ඇත. (සමරු නිර්මාණ 20 ද ඇතුලත්ව)

ඒ අනුව මොරටුව ජා.මෝ.ම. වැඩහල තුල හා නත්තරම්පොත ජා.මෝ.ම. වැඩහල තුල එක් එක් අංශ හරහා සකස් කරන ලද නව නිර්මාණයන්හි මූලදර්ශ ප්‍රමාණයන් පහත පරිදි වේ.




<u>**හස්තකර්මාන්ත නව නිර්මාණ තුලින් සමරු නිර්මාණ එළිදැක්වීම**</u>

ලෝකය පුරා පරිසර හිතකාමී නිෂ්පාදන කෙරෙහි වැඩි අවධානයක් යොමු වීමත්, දේශීය සංචාරක කර්මාන්තයේ වර්ධනයත් සමඟ මෙරටට සංචාරකයින්ගේ පැමිණීමේ ප්‍රවනතාවය ඉහල යාමත් දේශීය හස්තකර්මාන්ත නිෂ්පාදන සඳහා හොද ඉල්ලුමක් ඇති වීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත.
ඒ අනුව දේශීය මෙන්ම විදේශීය සංචාරකයින් හස්තකර්මාන්ත ක්ෂේත්‍රය හරහා බිහිවන පරිසර හිතකාමී සමරු නිර්මාණ කෙරෙහි වැඩි ආකර්ෂණයක් දක්වයි.

ඒ අනුව, හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට නිරතුරුවම නව නිර්මාණ සැලසුම් කරනු ලබන ජාතික මෝස්තර මධ්‍යස්ථානය දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් නිෂ්පාදනය කළහැකි සමරු නිර්මාණ සඳහා ද නව නිර්මාණ සැලසුම් කරමින් හස්තකර්මාන්ත ශිල්පීන්ට එම නිර්මාණ හදුන්වාදිමට කටයුතු කරයි. ඒ අනුව මෙම වර්ෂයේ සමරු නිර්මාණ 20ක් නිර්මාණය කිරීමට ඉලක්ක කර සපුරා ගන්නා ලදි.

## <u>නව නිර්මාණ සංවර්ධන ප්‍රායෝගික පුහුණු වැඩසටහන්</u>

### 1. ක්‍රියාකාරී සැලැස්ම යටතේ

මෙම වර්ෂය සඳහා අනුමත ප්‍රාග්ධන ප්‍රතිපාදන හරහා රු.මි. 1.065 ක් නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද අතර, ඒ හරහා දැනුවත් කිරීම්, මූලික පුහුණු වැඩසටහන්, උසස් පුහුණු වැඩසටහන්, උපදේශාත්මක වැඩසටහන් ඇතුළුව නව නිර්මාණ හදුන්වාදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 15ක් පැවැත්වීමට හා ප්‍රතිලාභින් 300 දෙනෙකුට ඒ හරහා පුහුණුව ලබා දීමට ඉලක්ක කරන ලදි.

ඒ අනුව සැලසුම් කළ පරිදි නව නිර්මාණ හදුන්වාදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 15ක් හා විවිධ ආයතන වලින් ලද ඉල්ලීම් මත පුහුණු වැඩසටහන් 04ක් දිවයින පුරා තෝරාගත් ප්‍රදේශ වල සිදු කරමින් ප්‍රතිලාභීන් 293 දෙනෙකුට අවශ්‍ය පුහුණුව හරහා වෙළඳපලට ගැලපෙන නව නිර්මාන හදුන්වා දෙන ලදි.

### ක්‍රියාකාරී සැලැස්ම යටතේ සිදුකරන ලද නව නිර්මාණ සංවර්ධන වැඩසටහන්

| | වැඩසටහන | ක්ෂේත්‍රය | දිනය | දිස්ත්‍රික්කය/ ගම්මානය/ ස්ථානය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | හදුන්වා දුන් නව නිර්මාණ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන | රතු මැටි | සැප්.01-03 දින 03 | යාපනය -චන්කනේ | 13 | 13 |
| 2 | දැනුවත් කිරීමේ වැඩසටහන | සම් | ජූලි | මාතලේ -ගලේවෙල | 15 | 03 |
| | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන | | නොවැ.19 දින 03 | | | |
| 3 | නව නිර්මාණ පිළිබඳ උපදේශන වැඩසටහන | පන් හා කෙඳි - ගල්ලෑහැ | ජූනි 30 | ගම්පහ-සීදුව-දඹුදුරේ | 20 | 07 |
| | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන | | ජූලි 18- දින 3 | | | |
| 4 | නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන | දැව ආශ්‍රිත - බෙර | ජූලි 10 -දින2 | ගම්පහ-අත්තනගල්ල - අලවල | 13 | 05 |
| 5 | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන | රෙදිපිළි | ජූලි 22 -දින2 | කොළඹ-මොරටුව | 10 | 03 |
| 6 | දැනුවත් කිරීමේ වැඩසටහන | උණ හා වේවැල් | ජූනි 19 | රත්නපුර-කුරුවිට | 12 | 20 |
| | නව නිර්මාණ පිළිබඳ උපදේශන වැඩසටහන | | ජූලි 29 | | | |
| | නව නිර්මාණ හදුන්වා දීමේ වැඩසටහන | | නොවැ.11 | | | |
| 7 | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන | රතු මැටි | අගෝ.26 දින 3 | මාතර-වැලිගම-කුඹල්ගම | 21 | 12 |
| 8 | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන | කොහු | ජූලි 28 - දින 6 | මාතර-දෙවිනුවර-ගන්දර | 23 | 15 |
| 9 | නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන | පොල්කටු ආශ්‍රිත | ඔක්.09 දින 03 | ගම්පහ-ජාඇල | 17 | 15 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2 වන අදියර | | ඔක්.31 දින 01 | | | |
| 10 | දැනුවත් කිරීමේ වැඩසටහන | ආභරණ මැටි හා විවිධ | ජූලි 02 | කොළඹ- කඩුවෙල | 31 | 16 |
| | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන | | ජූලි 16 - දින 2 | | | |
| | උසස් පුහුණු වැඩසටහන | | සැප්.01 දින 04 | | | |
| 11 | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන | රෙදිපිළි- බතික් | සැප්.16 දින 03 | නුවරඑළිය- කොත්මලේ | 21 | 20 |
| | උසස් නිමාවන් හා නව තාක්ෂණය හදුන්වාදීම | | ඔක්.07 දින03 | | | |
| 12 | ශිල්පීන් හදුනා ගැනීම හා දැනුවත් කිරීමේ වැඩසටහන | දැව | ජූනි 24 දින 2 | කොළඹ-මොරටුව | 05 | 10 |
| | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන | | අගෝ.27 දින 2 | | | |
| 13 | ශිල්පීන් හදුනා ගැනීම හා දැනුවත් කිරීමේ වැඩසටහන | දැව | ජූනි 24 දින 2 | කොළඹ-මොරටුව | | 25 |
| | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන | | අගෝ.27 දින 2 | | | |
| 14 | නව නිර්මාණ පිළිබඳ උපදේශන වැඩසටහන | රෙදිපිළි - බීරළු | ජූනි 18 දින 2 | ගාල්ල-මාගාල්ල | 15 | 5 |
| | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන | | ජූලි 16 - දින 5 | | | |
| | උසස් නිමාවන් හා නව තාක්ෂණය හදුන්වාදීම | | සැප්.18 දින 03 | | | |
| 15 | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන | ලාක්ෂා | අගෝ.03 දින 3 | මාතලේ-පහලහපුවිද | 15 | 15 |

## රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් මත සිදු කරන ලද වැඩසටහන්

| වැඩසටහන | ක්ෂේත්‍රය | දිස්ත්‍රික්කය/ ගම්මානය/ ස්ථානය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | පැවැත්වූ දිනයන් | හදුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | ඉල්ලීම කරන ලද ආයතනය |
|---|---|---|---|---|---|---|
| නව නිර්මාණ, නව නිමාවන් හා නව තාක්ෂණික වැඩසටහන | දැව | කෑගල්ල- වරකාපොල | 25 | මාර්තු 27 දින 02 | 21 | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය |
| නව නිර්මාණ සංවර්ධන වැඩසටහන | සම් | මහනුවර- නත්තරම්පොත | 05 | අප්‍රේල් 27 දින 03 | 05 | ශිල්පීන් කණ්ඩායමකගේ ඉල්ලීම මත |
| වත්තේගම අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් සඳහා අත්කම් පුහුණු වැඩසටහන | ඉවත ලන ද්‍රව්‍ය මඟින් අත්කම් | මහනුවර- වත්තේගම | 17 | ජූලි 28 | 10 | වත්තේගම බාලිකා විද්‍යාලය |
| නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන | පිත්තල | මහනුවර- පිලිමතලාව | 15 | ජූලි 2 දින 04 | 10 | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය |

## රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රතිපාදන යටතේ සිදු කරන ලද වැඩසටහන් -2015

යූඑන්ඩීපී (UNDP), ඔක්ස්ෆෑම් (OXFAM) වැනි රාජ්‍ය නොවන සංවිධාන වල ඉල්ලීම් හා ප්‍රතිපාදන යටතේ ආරම්භ කරන ලද ව්‍යාපාති හරහා හම්බන්තොට, මඩකලපුව , වවුනියාව හා මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි හස්තකර්මාන්ත ක්ෂේත්‍රයේ යෙදී සිටින්නන්ට හා ක්ෂේත්‍රයට නවක තරුණ කණ්ඩායම් සඳහා වෙළඳපලට ගැලපෙන නව නිර්මාණ හදුන්වාදීම හා නව තාක්ෂණික දැනුම ලබාදීම සඳහා මූලික පුහුණු වැඩසටහන්, උසස් පුහුණු වැඩසටහන් මෙන්ම පසු විපරම් වැඩසටහන් පහත ආකාරයට සිදු කර ඇත.

| | වැඩසටහන | ක්ෂේත්‍රය | කාලය | දිස්ත්‍රික්කය/ගම්මානය/ ස්ථානය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **OXFAM ආයතනයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්** | | | | | |
| 1 | මූලික පුහුණු වැඩසටහන<br>උසස් පුහුණු වැඩසටහන<br>පසුවිපරම් වැඩසටහන | තල්කොල | පෙබ.16 -18<br>අප්‍රේල් 26-29<br>ජූනි 20 -23 | හම්බන්තොට- වීරවිල | 15 |
| 2 | මූලික පුහුණු වැඩසටහන<br>උසස් පුහුණු වැඩසටහන<br>පසුවිපරම් වැඩසටහන | කොහු | පෙබ.16 -19<br>මාර්තු.15 -19<br>මැයි 25-29 | හම්බන්තොට- තංගල්ල | 13 |
| 3 | මූලික පුහුණු වැඩසටහන<br>උසස් පුහුණු වැඩසටහන<br>පසුවිපරම් වැඩසටහන | රතුමැටි | පෙබ.10 -12<br>මැයි 06 -10<br>ජූනි 17-21 | හම්බන්තොට- කැලියපුර | 14 |
| 4 | මූලික පුහුණු වැඩසටහන<br>උසස් පුහුණු වැඩසටහන | සම්/රෙක්සීන් | මාර්තු.10 -12<br>මැයි 26 -29 | හම්බන්තොට- සීනක්කුව | 5 |
| 5 | මූලික පුහුණු වැඩසටහන<br>උසස් පුහුණු වැඩසටහන<br>පසුවිපරම් වැඩසටහන | සම්/රෙක්සීන් | මාර්තු.24 -26<br>මැයි 12 -15<br>සැප්,15-18 | මඩකලපුව -පානම | 9 |
| 6 | මූලික පුහුණු වැඩසටහන<br>උසස් පුහුණු වැඩසටහන | පන් හා කෙඳි | මාර්තු.03 -05<br>මැයි 26 -29 | මඩකලපුව-උරුගමම් | 20 |
| 7 | මූලික පුහුණු වැඩසටහන<br>උසස් පුහුණු වැඩසටහන<br>පසුවිපරම් වැඩසටහන | රතුමැටි | මාර්තු.02 -04<br>මාර්තු.24 -26<br>මැයි 19 -21 | මඩකලපුව-එරාවූර් | 30 |
| 8 | මූලික පුහුණු වැඩසටහන<br>උසස් පුහුණු වැඩසටහන | පන් හා කෙඳි | මාර්තු.16 -18 | මඩකලපුව-කිච්චන්පල<br>මඩකලපුව-ඕලිකුල | 25 |
| 9 | මූලික පුහුණු වැඩසටහන<br>උසස් පුහුණු වැඩසටහන<br>පසුවිපරම් වැඩසටහන | අත්යන්ත්‍ර රෙදි | මාර්තු.17 -19<br>මැයි 08 -14<br>අගෝ.10-15 | මඩකලපුව-ආරියන්පත්තු | 10 |
| 10 | මූලික පුහුණු වැඩසටහන<br>උසස් පුහුණු වැඩසටහන | පාවහන් | මාර්තු.24 -26<br>සැප්.15-18 | මඩකලපුව-ආරියන්පත්තු | 10 |
| 11 | මූලික පුහුණු වැඩසටහන<br>උසස් පුහුණු වැඩසටහන | පන් හා කෙඳි | මාර්තු.26 -29<br>අගෝ..10 -14 | මඩකලපුව-එරාවූර් | 20 |

| **UNDP ආයතනයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්** | | | | | |
|---|---|---|---|---|---|
| 12 | ශිල්පීන් හදුනා ගැනීම, තොරතුරු රැස් කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන | විවිධ ක්ෂේත්‍ර | ජන.26-29 | මඩකලපුව | |
| 13 | ශිල්පීන් හදුනා ගැනීම, තොරතුරු රැස් කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන | විවිධ ක්ෂේත්‍ර | පෙබ.23-25 | මන්නාරම හා වවුනියාව | |
| 14 | මූලික පුහුණු වැඩසටහන | සම්/රෙක්සීන් | ජූලි.27 -31 | වවුනියාව | 29 |
| 15 | මූලික පුහුණු වැඩසටහන | තල්කොළ | ජූලි.27 -31 | මඩලකපුව- ආරියම්පති | 19 |
| 16 | මූලික පුහුණු වැඩසටහන | පොල්කටු ආශ්‍රිත | ජූලි.27 -31 | මඩලකපුව | 26 |
| 17 | මූලික පුහුණු වැඩසටහන | සිප්පි | ජූලි.27 -31 | මඩලකපුව- වාකරෙයි | 20 |
| 18 | මූලික පුහුණු වැඩසටහන | සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ | ජූලි.27 -31 | මන්නාරම- මුරුගන්පිටි | 27 |
| 19 | මූලික පුහුණු වැඩසටහන | දැව- විසිතුරු | ජූලි.20 -24 | මන්නාරම - අඩප්පන් | 21 |
| 20 | මූලික පුහුණු වැඩසටහන | තල්කොළ | ජූලි.27 -31 | වවුනියාව | 21 |
| 21 | මූලික පුහුණු වැඩසටහන | පොල්කටු ආශ්‍රිත | අගෝ..01 -05 | මඩලකපුව- වාලච්චේන | 26 |
| 22 | මූලික පුහුණු වැඩසටහන | කොහු | අගෝ..24 -28 | මඩලකපුව- වාලච්චේන | 25 |
| 23 | මූලික පුහුණු වැඩසටහන | වේවැල් | අගෝ..03 -07 | මඩලකපුව- එරාවූර් | 22 |
| 24 | මූලික පුහුණු වැඩසටහන | කොහු | අගෝ..24 -28 | මඩලකපුව- වාකරෙයි | 25 |
| 25 | මූලික පුහුණු වැඩසටහන | තල්කොළ | ජූලි.27 -31 | මඩලකපුව- වෙන්කලඩි | 31 |
| 26 | මූලික පුහුණු වැඩසටහන | රතුමැටි | සැප්.07 -11 | මඩලකපුව- වෙල්ලවාලෙයි | 28 |
| 27 | මූලික පුහුණු වැඩසටහන | රතුමැටි | සැප්.12 -16 | මඩලකපුව- එරාවූර් | 30 |
| 28 | මූලික පුහුණු වැඩසටහන | රතුමැටි | සැප්.28 -ඔක්.02 | මඩලකපුව - වවුනතිවූ | 20 |
| 29 | මූලික පුහුණු වැඩසටහන | සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ | අගෝ31-සැප් 04 | මන්නාරම- අඩප්පන් | 25 |
| 30 | මූලික පුහුණු වැඩසටහන | සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ | සැප්.28 -ඔක්.02 | මන්නාරම | 20 |
| 31 | මූලික පුහුණු වැඩසටහන | බතික් | සැප්.14 -18 | මන්නාරම- මුරුගන්පිටි | 20 |
| 32 | මූලික පුහුණු වැඩසටහන | තල්කොළ | සැප්.14 -18 | මඩලකපුව- වාලච්චේන | 25 |
| 33 | මූලික පුහුණු වැඩසටහන | තල්කොළ | සැප්.14 -18 | මඩලකපුව- වවුනතිව් | 25 |
| 34 | මූලික පුහුණු වැඩසටහන | ගල්ලැහැ | ඔක්.12-16 | මඩලකපුව- ආරියම්පති | 29 |
| 35 | මූලික පුහුණු වැඩසටහන | තල්කොළ | ඔක්.19-23 | මන්නාරම- පල්ලේකාමම් | 22 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 36 | මූලික පුහුණු වැඩසටහන | තල්කොළ | සැප්.-28-ඔක්.02 | මන්නාරම- නරිවිල්කුලම් | 20 |
| 37 | මූලික පුහුණු වැඩසටහන | තල්කොළ | සැප්.-28-ඔක්.02 | මන්නාරම- පුදුකාමම් | 20 |
| 38 | මූලික පුහුණු වැඩසටහන | තල්කොළ | ඔක්.-26-30 | මන්නාරම- පැඩපැඩි | 22 |
| 39 | මූලික පුහුණු වැඩසටහන | තල්කොළ | ඔක්.-26-30 | මන්නාරම- පල්ලකාමම් | 20 |
| 40 | මූලික පුහුණු වැඩසටහන | කොහු | ඔක්.-05-09 | මඩලකපුව- වවුනතිවු | 12 |
| 41 | මූලික පුහුණු වැඩසටහන | රෙදිපිලි | ඔක්.-12-16 | මඩලකපුව- ආරියම්පති | 25 |
| 42 | මූලික පුහුණු වැඩසටහන | වේවැල් | සැප්.28- ඔක්.02 | මඩලකපුව- ආරියම්පති | 14 |
| 43 | මූලික පුහුණු වැඩසටහන | සිප්පි | ඔක්.12- 16 | මන්නාරම- වෙස්තලතිව් | 25 |
| 44 | මූලික පුහුණු වැඩසටහන | රතුමැටි | ඔක්.18- 20 | අනුරාධපුරය- නොච්චියාගම | 33 |
| 45 | මූලික පුහුණු වැඩසටහන | කොහු | ඔක්.05- 09 | මඩලකපුව- පට්ටිපලෙයි | 22 |
| 46 | උසස් පුහුණු වැඩසටහන | තල්කොළ | නොවැ.-16-20 | මන්නාරම- පෙරියර්කන්ඩල් | 21 |
| 47 | මූලික පුහුණු වැඩසටහන | තල්කොළ | නොවැ.-16-20 | මඩලකපුව- වාලච්චේන | 16 |
| 48 | මූලික පුහුණු වැඩසටහන | සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ | නොවැ.-16-20 | මඩලකපුව- වාලච්චේන | 24 |
| 49 | ශිල්පීන් හදුනා ගැනීම, තොරතුරු රැස් කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන | විවිධ ක්ෂේත්‍ර | සැප්.22-23 | අම්පාර | 80 |
| 50 | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන | හණ | ඔක්.23 දින 08 | මාතලේ - ආලෝකගම (කැන්ඩි රොටරි ක්ලබ් විසින් කරන ලද ඉල්ලීම මත) | 20 |

## 2. සාම්ප්‍රදායික හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන - 2015

සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් දියත් කරනු ලැබූ මෙම ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් නොවූ මුත්, 2014 වර්ෂයේ එම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කෙරුණු ගම්මානයන්හි ශිල්පීන් සඳහා උපකරණ බෙදදීම හා වැඩහල් පැවරීම වැනි කටයුතු මුල්කරගෙන සංවර්ධනය කෙරුණු පහත සඳහන් ගම්මාන විවෘත කිරීමේ වැඩසටහන් 04ක් **දින 100 සංවර්ධන වැඩසටහන** යටතේ සිදු කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කරන ලදි.

| **දිස්ත්‍රික්කය** | **ගම්මානය** | **හස්තකර්මාන්ත ක්ෂේත්‍රය** |
|---|---|---|
| මාතර | කුඹල්ගම | රතුමැටි |
| යාපනය | අල්ලාරෙයි | කොහු |
| පොලොන්නරුව | මනම්පිටිය | වේවැල් |
| මාතර | කියාදුව | උණ හා වේවැල් |

## හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට නව නිර්මාණ හදුන්වා දීම

හස්තකර්මාන්ත ක්ෂේත්‍රය තුල වෙලඳපලට ගැලපෙන නව නිර්මාණ සැලසුම් කිරීම ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයක් වන අතර, එසේ සැලසුම් කරන ලද නව නිර්මාණ විවිධ ආකාරයෙන් හස්තකර්මාන්ත ශිල්පියා වෙත යොමු කරවීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය ක්‍රියා කරයි. ක්‍රියාකාරී සැලැස්ම යටතේ, රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රතිපාදන යටතේ , රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් යටතේ සිදුකරනු ලබන නව නිර්මාණ හදුන්වාදීමේ පුහුණු වැඩසටහන් හරහා මෙන්ම ආයතනයේ වැඩහල් වෙත පැමිණ පුහුණුවීම් ලබන්නන් හරහා සහ ශිල්පීන්ගේ ඉල්ලීම හා අවශ්‍යතාවය මත ලබා දෙන නව නිර්මාණ සැලසුම් මඟින් ජාතික මෝස්තර මධ්‍යස්ථානය හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට නව නිර්මාණ හදුන්වාදෙනු ලබයි.

ඒ අනුව ඉහත ආකාරයන්ගෙන් 2015 වර්ෂය තුල ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සැලසුම් කරන ලද නව නිර්මාණ 390ක් හදුන්වාදීමට ඉලක්ක කරමින් නව නිර්මාණ 582ක් සත්‍ය වශයෙන් හදුන්වාදීමට කටයුතු කර ඇත.

## හස්තකර්මාන්ත නව නිෂ්පාදන සංවර්ධන වැඩසටහන

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සැලසුම් කරනු ලබන නව නිර්මාණ විවිධ ආකාරයෙන් හස්තකර්මාන්ත ශිල්පීන්ට හදුන්වාදීමට කටයුතු කරන අතරතුර, තෝරා ගත් හස්තකර්මාන්ත ශිල්පීන් හරහා එම නිර්මාණ නිෂ්පාදනය කර වෙළඳපලට හදුන්වාදීමට සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කර ඇත.
එහිදී සැලසුම් කළ නව නිර්මාන වලින් වඩාත් ප්‍රශස්ථ නිර්මාණ සැලසුම් තෝරා ගෙන ඒවා උසස් තත්වයෙන් නිෂ්පාදනය කරනු ලබන හස්තකර්මාන්ත ශිල්පීන් හරහා නිෂ්පාදනය කරවීම මෙම වැඩපිළිවෙලෙහි මූලික කාර්යය වන අතර, එසේ ඔවුන් විසින් නිෂ්පාදනය කරනු ලබන නිර්මාණ ගැණුම්කරුවන්ට හදුන්වාදීම යුගයට නිමැවුම්- 2015 නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත ප්‍රදර්ශණය හරහා සිදු කෙරේ.

මෙම වැඩසටහන සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශ වල සිට හස්තකර්මාන්ත ක්ෂේත්‍රයේ යෙදී සිටින හස්තකර්මාන්ත ශිල්පීන් 125 දෙනෙකු සම්බන්ධ කර ගැනිමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කරන ලදි. ඔවුන්ට මෙම වැඩසටහන හරහා
නව නිර්මාණ නිෂ්පාදනයට යොමු වීමට
නව නිර්මාණ නිෂ්පාදනය තුලින් ආර්ථික වර්ධනයක් ඇති කරගැනිමට
නව නිර්මාණ හරහා ලැබෙන ඇනවුම් ඔස්සේ තම වෙළඳපල පුළුල් කර ගැනීමට හැකියාව ලැබුණි.

## අලෙවි පර්යේෂණ වැඩසටහන්

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් නිර්මාණය කරනු ලබන වෙළඳපලට ගැලපෙන නව නිර්මාණ, කොතෙක් වෙළඳපල තුල ප්‍රචලිත වේද යන්න පිළිබඳ නිරීක්ෂණය කිරීම සඳහා මෙම වර්ෂය තුල අලෙවි පර්යේෂණ වැඩසටහන් 08ක් ඉලක්ක කරන ලදි.

ඒ අනුව ලංකා හස්තකර්මාන්ත මණ්ඩලය - ලක්සල හා ලක්පහන යන ආයතන හරහා විවිධ හස්තකර්මාන්ත ක්ෂේත්‍ර නියෝජනය වන ලෙස 2015 වර්ෂයේ තෝරාගත් නව නිර්මාණ පෙළක් ඉදිරිපත් කරමින් අලෙවි පර්යේෂන වැඩසටහන් 03ක් ක්‍රියාත්මක කරමින් ද, යුගයට නිමැවුම්- 2015 නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත ප්‍රදර්ශණ කාලය තුල එක් එක් හස්තකර්මාන්ත ක්ෂේත්‍ර වෙනුවෙන් පාරිභෝගික නැඹුරුව කෙසේ ද යන්න පිලිබඳ අධ්‍යයන කරමින් අලෙවි පර්යේෂන වැඩසටහන් 05ක් ද ක්‍රියාත්මක කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ අලෙවි හා තොරතුරු අංශය විසින් කටයුතු කරන ලදි.

මෙම වැඩසටහන් හා යුගයට නිමැවුම්- 2015 නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත ප්‍රදර්ශණ හරහා රු. මිලියන 2.816ක වටිනාකමින් යුත් නව නිර්මාණ අලෙවි කරමින් ඒ හරහා හස්තකර්මාන්ත ශිල්පියාගේ ආර්ථිකය යහපත් කිරීමට දායක වීමට හැකිවිය.

## යුගයට නිමැවුම්- 2015 නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත ප්‍රදර්ශණය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය 2015 වර්ෂය තුල නිර්මාණය කර හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට හදුන්වාදුන් වෙළඳපලට ගැලපෙන නව නිර්මාණ ප්‍රදර්ශනාත්මකව ඉදිරිපත් කිරීම සඳහා සංවිධානය කළ යුගයට නිමැවුම්- 2015 නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත ප්‍රදර්ශණය, මෙම වර්ෂයේ දෙසැම්බර් මස 11-12-13 යන දින වලදී මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් හිදී පැවැත්වීමට කටයුතු යෙදුණි.

හස්තකර්මාන්ත නව නිෂ්පාදන සංවර්ධන වැඩසටහන හරහා සංවර්ධනය කෙරුණු නව නිර්මාණාත්මක නිෂ්පාදන 349ක් මෙම ප්‍රදර්ශණයට සමඟාමීව පැවති අලෙවි පොළ හරහා පාරිභෝගිකයා වෙත ආකර්ෂනය කරවීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානයට හැකියාව ලැබුණි.

## ජාතික ශිල්ප සභාව සමඟ සම්බන්ධිකරණය

### ශිල්ප 2015 ජාතික ප්‍රදර්ශණය

ජාතික ශිල්ප සභාව විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන උක්ත ප්‍රදර්ශණයේ පූර්ව රාජකාරි යටතේ දිස්ත්‍රික් මට්ටමින් හස්තකර්මාන්ත ශිල්පීන් දැනුවත් කිරීමේ සියළු වැඩසටහන් සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ දායකත්වය ලබාදෙමින් නව නිර්මාණ සම්බන්ධ උපදේශකත්වය ලබාදීමට කටයුතු කෙරුණි.

## වෙනත් ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය

**ඊට අමතරව පහත සඳහන් ප්‍රදර්ශන සඳහා සහභාගි වෙමින් ප්‍රදර්ශණ පැවැත්වූ කාලය තුල නව නිර්මාණ ප්‍රදර්ශන කුටි පවත්වාගෙන යමින් නරඹන්නන්ට ආයතනය පිළිබඳ හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරන ලදි.**

**ජාතික ව්‍යවසාය සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කර ලද** Business Development Service & Trade Fair –ප්‍රදර්ශණය සැප්තැම්බර් 24, 25 හා 26 දිනයන් හි අනුරාධපුරයේ පවත්වන ලද අතර ඒ සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය සහභාගි වන ලදි.

සැප්තැම්බර් 30 සිට ඔක්.04 දක්වා පවත්වන ලද අම්පාර දිගාමඩුළු නවෝදය ප්‍රදර්ශණය සඳහා සහභාගිත්වය

නොවැම්බර් 19 සිට පවත්වන ලද රුහුණු රන්සලු - රුහුණු කලා අධ්‍යාපන ප්‍රදර්ශනය සඳහා සහභාගිත්වය

දෙසැම්බර් 19 හා 20 දිනයන්හිදී මහනුවර ග්‍රෑන්ඩ් කැන්ඩියන් හෝටලයේ පැවති ප්‍රදර්ශණයට සහභාගි වීම හරහා නව නිර්මාණ එළිදැක්වීම හා නව නිර්මාණ අලෙවි කිරීම සිදු කරන ලදි.

ගාලු සමය ප්‍රදර්ශනය දෙසැම්බර් 26 සිට දින 07ක් පැවැත්වූ අතර, ඒ සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය සහභාගි වෙමින් දායකත්වය දක්වන ලදි.

## පුස්තකාල සේවා සහ තොරතුරු සැපයීම

කටුබැද්ද ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ මෙන්ම නත්තරම්පොත ශාඛා කාර්යාලයේ පිහිටි පුස්තකාල සඳහා වෙන්කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන හරහා මේ වර්ෂය වෙනුවෙන් රු.190,887.65 නව පොත් මිලදී ගෙන පුස්තකාලයේ පොත් එකතුව වැඩි කර පුස්තකාලය සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදි.

හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට අදාල විශේෂිත මෙන්ම දුලබ පොත් එකතුවක් සහිත මෙම පුස්තකාලය ක්ෂේත්‍රයට අදාල අධ්‍යයන කටයුතු වල යෙදෙන විශ්ව විද්‍යාල සිසුන්ට අවශ්‍ය දැනුම ලබා ගැනීමට විශාල පිටුවහලක් වන අතර, ඊට අමතරව හස්තකර්මාන්ත ශිල්පීන්ට හා ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් සඳහා අවශ්‍ය පුස්තකාල සේවා ලබාදීම, තොරතුරු සැපයීම හා පොත් ආශ්‍රයෙන් අවශ්‍ය නිර්මාණයන්හි ඡායා පිටපත් ලබාදීමේ සේවාවද මේ හරහා සිදුකිරීමට කටයුතු කෙරුණි.

## පිරිනිර්මාණ අධ්‍යාපන හා පුහුණු කටයුතු

### ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ ආයතනය

ඉතා සීග්‍රයෙන් සමාජයේ අවධානයට පාත්‍ර වූ ක්ෂේත්‍රයක් වන ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරනය ප්‍රධාන විෂයය කොටගත් ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හා ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව වශයෙන්

පාඨමාලා 02ක් ජාතික මෝස්තර මධ්‍යස්ථානය යටතේ ක්‍රියාත්මක ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ ආයතනය මඟින් ක්‍රියාත්මක කර ඇත.

මෙම පාඨමාලා හරහා මෙම ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන තරුණ තරුණියන්ට අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දීම හරහා ඔවුන්ට මෙම ක්ෂේත්‍රයේ ඉදිරියට යෑමට අවශ්‍ය මාර්ගය විවර කර ඇති අතර, ඒ හරහා ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කර ගැනිමට අවශ්‍ය අඩිතාලම ලබාදීම තුලින් වෘත්තීය මට්ටමේ නිර්මාණකරුවන් බිහි කිරීමට කටයුතු කෙරේ.
ඉහත පාඨමාලා සති අන්ත පාඨමාලා ලෙස ක්‍රියාත්මක කෙරෙන අතර, මෙම වර්ෂයේ මෙම පාඨමාලා හැදෑරූ සිසු සිසුවියන් සංඛ්‍යාව පහත පරිදි වේ.

ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2014 - 2015) (සති අන්ත) මෙම පාඨමාලාව සඳහා සිසුන් 18 දෙනෙකු සම්බන්ධ විය

ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2014 - 2015) (සති අන්ත) මෙම පාඨමාලාව සඳහා සිසුන් 56 දෙනෙකු සම්බන්ධ විය.

## ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවය

පසුගිය වසර කිහිපයක ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කළ ඩිප්ලොමාධාරීන් සඳහා ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවයක් ප්‍රථම වරට මෙම වසරේ සංවිධානය කරන ලදි.

2015 ජූනි 09 වන දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී මෙම උත්සවය පවත්වන ලද අතර, එහිදී පහත ආකාරයට සිසු සිසුවියන් සහතික ලබාගන්නා ලදි.

ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2014 - 2015) යටතේ සිසු සිසුවියන් 29 දෙනෙකු ද,

ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2008 - 2011) යටතේ සිසු සිසුවියන් 16 දෙනෙකු ද,

ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2011 - 2014) යටතේ සිසුන් 02 ක් වශයෙනි.

## ජාතික මෝස්තර මධ්‍යස්ථානයෙන් සේවා ලබාදීම

2015 වර්ෂය තුල නව නිර්මාණ දැනුවත් කිරීමේ හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන්, ඇනවුම් හා අලෙවි අවස්ථා ලබාදීම, වෙළඳපල,ශිල්පීන්, ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු ලබාදීම, ආයතනයේ වැඩහල තුල ප්‍රායෝගික පුහුණුව ලබාදීම, පොදු පහසුකම් ලබාදීම, ආයතනයට පැමිණ/ ඉල්ලීම් මත මෝස්තර ලබාදීම (ග්‍රැෆික් නිර්මාණ ඇතුළුව), පුස්තකාල සේවා ලබාදීම අලෙවි ප්‍රවර්ධනය හා අලෙවි පර්යේෂණ වැඩසටහන් වැනි සේවාවන් හරහා 1957 දෙනෙකුට සේවාවන් ලබාදීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කර ඇත.

ඊට අමතරව, හස්තකර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන හා අධ්‍යන කටයුතු සිදුකරන විශ්ව විද්‍යාල හා පාසල් සිසුන්ට හස්තකර්මාන්ත ක්ෂේත්‍රය මුල් කරගෙන සිදු කරන ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන න්‍යයාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීමට හා ආයතනයට කණ්ඩායම් වශයෙන් පැමිණෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හා ගුරුවරුන්ට දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින් අවශ්‍ය සේවාවන් ලබාදීමට කටයුතු කරන ලදි.

### ජාතික මෝස්තර මධ්‍යස්ථානය
### 2015 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය

| ව්‍යාපෘතිය/ වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම් | නිර්ණායක | නිමවුම් ඉලක්කය | සපුරා ගැනීම් | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය** - වෙළඳපලට ගැලපෙන හා වටිනාකම් එකතුකළ හැකි නව නිර්මාණ සංවර්ධනය | හස්තකර්මාන්ත ක්ෂේත්‍රය සඳහා නව නිර්මාණ සැලසුම් කිරීම | නව නිර්මාණ සංඛ්‍යාව | 650 | 837 | 20 |
| රු.මි. 4.725 | මෝස්තර සංවර්ධන අංශය සඳහා කාර්යාල උපකරණ ලබාදීම | | | | 87 |
| **කාල වකවානුව**- වාර්ෂික | නව නිර්මාණ මූලාදර්ශ බවට පත් කිරීම | මූලාදර්ශ සංඛ්‍යාව | 390 | 435 | 61 |
| **නව/ දැනට ක්‍රියාත්මක** - දැනට ක්‍රියාත්මක | ත්‍යාග හා සමරු නිර්මාණ සංඛ්‍යාව | ත්‍යාග හා සමරු නිර්මාණ සංඛ්‍යාව | 20 | 20 | |
| **ක්‍රියාත්මක ආයතනය**- ජාතික මෝස්තර මධ්‍යස්ථානය | ශිල්ප සංවර්ධනයට යන්ත්‍ර හා උපකරණ ලබාදීම හා වැඩහල් වැඩි දියුණු කිරීම | | | | 56 |
| | වැඩහල් වලට අවශ්‍ය කාර්යාල උපකරණ, අළුත්වැඩියා, වැඩිදියුණු කිරීම් හා නත්තරම්පොත පොදු පහසුකම් මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම | | | | 95 |

| ව්‍යාපෘතිය/ වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම් | නිර්ණායක | නිමවුම් ඉලක්කය | සපුරා ගැනීම් | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය** - නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන | ජා.මෝ.ම. අරමුදල් යටතේ නව | වැඩසටහන් සංඛ්‍යාව | 15 | 19 | 106 |

| | | | | | |
|---|---|---|---|---|---|
| රු.මි. 1.065<br>**කාල වකවානුව**- වාර්ෂික<br>**නව/ දැනට ක්‍රියාත්මක** - දැනට ක්‍රියාත්මක<br>**ක්‍රියාත්මක ආයතනය**- ජාතික මෝස්තර මධ්‍යස්ථානය | නිර්මාණ හදුන්වාදිම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, නව නිර්මාණ පුහුණු වැඩසටහන්, ශිල්ප උපදේශකවරුන් සඳහා වැඩසටහන් පැවැත්වීම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 300 | 283 | |
| **ව්‍යාපෘතිය** - යූඑන්ඩීපී සහ ඔක්ස්ෆෑම් ව්‍යාපෘතිය<br>රු.මි. 16.6<br>**කාල වකවානුව**- වාර්ෂික<br>**නව/ දැනට ක්‍රියාත්මක** - දැනට ක්‍රියාත්මක | පෞද්ගලික හා රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් මත සිදු කරන පුහුණු වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | 30 | 50 | 83 |
| | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 600 | 1081 | |
| | නව නිර්මාණ ශිල්පීන්ට හදුන්වාදීම | හදුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | 390 | 582 | -- |

| **ව්‍යාපෘතිය/ වැඩසටහන** | **ප්‍රධාන ක්‍රියාකාරකම්** | **නිර්ණායක** | **නිමවුම් ඉලක්කය** | **සපුරා ගැනීම්** | **මූල්‍ය ප්‍රගතිය (%)** |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය** - සාම්ප්‍රදායික හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන<br>රු.මි. 1.735<br>**කාල වකවානුව**- ජනවාරි-අප්‍රේල් 2015<br>**නව/ දැනට ක්‍රියාත්මක** - දැනට ක්‍රියාත්මක<br>**ක්‍රියාත්මක ආයතනය**- ජාතික මෝස්තර මධ්‍යස්ථානය | දින100 ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | 08 | 04 | 104 |

| **ව්‍යාපෘතිය/ වැඩසටහන** | **ප්‍රධාන ක්‍රියාකාරකම්** | **නිර්ණායක** | **නිමවුම් ඉලක්කය** | **සපුරා ගැනීම්** | **මූල්‍ය ප්‍රගතිය (%)** |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය**- නව නිර්මාණ අලෙවිකරණය<br>රු.මි.5.450<br>**කාල වකවානුව**: වාර්ෂික<br>**නව/ දැනට ක්‍රියාත්මක** - දැනට ක්‍රියාත්මක<br>**ක්‍රියාත්මක ආයතනය**- ජාතික මෝස්තර මධ්‍යස්ථානය | නව නිර්මාණ වෙළඳපලට හදුන්වාදීම | නව නිර්මාණ සංඛ්‍යාව | 60 | 349 | |
| | | අලෙවි කළ නව නිර්මාණයන්හි වටිනාකම රු.මි. | 7 | 2.817 | |
| | | අලෙවි පර්යේෂණ වැඩසටහන් සංඛ්‍යාව | 8 | 8 | |
| | ශිල්ප ජාතික ප්‍රදර්ශණයට සමගාමීව නව නිර්මාණ ප්‍රදර්ශණ | නව නිර්මාණ ප්‍රදර්ශණ සංඛ්‍යාව | 1 | 1 | 112 |
| | අනෙනුත් ආයතන වල සහයෝගයෙන් සංවිධානය කරන ප්‍රදර්ශන සඳහා | නව නිර්මාණ ප්‍රදර්ශණ සංඛ්‍යාව | 7 | 7 | 40 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සහභාගිත්වය | | | | |
| | නව නිර්මාණ සංවර්ධන වැඩසටහන | | | | 115 |
| | හස්තකර්මාන්ත ශිල්පීන්ව වෙළඳපලට සම්බන්ධ කිරීම | ශිල්පීන් සංඛ්‍යාව | 500 | 246 | |

| ව්‍යාපෘතිය/ වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම් | නිර්ණායක | නිමවුම් ඉලක්කය | සපුරා ගැනීම් | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය**- තොරතුරු, පසුවිපරම්, පර්යේෂණ හා සංවර්ධනය<br>රු.මි 2.025<br>**කාල වකවානුව**: වාර්ෂික<br>**නව/ දැනට ක්‍රියාත්මක** - දැනට ක්‍රියාත්මක<br>**ක්‍රියාත්මක ආයතනය**- ජාතික මෝස්තර මධ්‍යස්ථානය | අමුද්‍රව්‍ය සඳහා ආදේශන හා නව ක්‍රියාවලීන් සඳහා පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් | අමුද්‍රව්‍ය සඳහා ආදේශන හා නව ක්‍රියාවලීන් වැඩසටහන් | 04 | 03 | 47 |
| | අමුද්‍රව්‍ය, ක්‍රියාවලීන්, නිර්මාණ හා වෙළඳපල නැඹියාව යටතේ සංවර්ධනය හා මෙහෙයුම් දත්තයන් | | | | |
| | හස්තකර්මාන්ත ශිල්පීන් නගාසිටුවීම | පුහුණුව, තාක්ෂණය හා අලෙවි සම්බන්ධතා හරහා හස්තකර්මාන්ත ශිල්පීන් නගාසිටුවීම | 2000 | 1957 | |
| | -පරිගණක මෘදුකාංගයක් සංවර්ධනය කිරීම | | | | |
| | - ජා.මෝ.ම. වෙබ් අඩවිය | | | | 68 |
| | -කාර්ය මණ්ඩල පුහුණුව | | | | |
| | ජා.මෝ.ම. පොදු අංශ සඳහා කාර්යාල උපකරණ | | | | 100 |

| ව්‍යාපෘතිය/ වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම් | නිර්ණායක | නිමවුම් ඉලක්කය | සපුරා ගැනීම් | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය** - නව නිර්මාණ තුල පුහුණුව තාක්ෂණය හා නිර්මාණකරුවන්ගේ ධාරිතා සංවර්ධනය<br>රු.මි.4.4<br>**කාල වකවානුව** - වාර්ෂික<br>**නව/ දැනට ක්‍රියාත්මක** - දැනට ක්‍රියාත්මක<br>**ක්‍රියාත්මක ආයතනය**- ජාතික මෝස්තර මධ්‍යස්ථානය | ජාතික පිරිනිර්මාණ විද්‍යාලය හරහා ඩිප්ලෝමා පාඨමාලා සංවිධානය කිරීම | **බඳවා ගැනීම් - 2015** | | | |
| | | ගෘහ අභ්‍යන්තර අලංකරණ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සිසුන් සංඛ්‍යාව | 20 | 18 | |
| | | ගෘහ අභ්‍යන්තර අලංකරණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සිසුන් සංඛ්‍යාව | 60 | 70 | |
| | | **පවතින** | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ගෘහ අභ්‍යන්තර අලංකරණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සිසුන් සංඛ්‍යාව | 70 | 56 | |
| **ව්‍යාපෘතිය**- උපදේශන සේවා<br>**කාල වකවානුව** - වාර්ෂික<br>**නව/ දැනට ක්‍රියාත්මක** - දැනට ක්‍රියාත්මක<br>**ක්‍රියාත්මක ආයතනය**- ජාතික මෝස්තර මධ්‍යස්ථානය | රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල ඉල්ලීම මත උපදේශන සේවා සිදු කිරීම | උපදේශන සේවාවන්හි වටිනාකම රු.මි. | 5 | 16.6 | |
| | | ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර අලංකරණ නිර්මාණ සංඛ්‍යාව | 40 | 52 | |

2015 වසරේ නිෂ්පාදිත නව හස්ත කර්මාන්ත නිමැවුම් කිහිපයක්





රතු මැටි





කොහු





# New Designs - 2015

## දැව








## පන් හා කෙඳි







## උණ හා වේවැල්








පිත්තල






ආභරණ





ලාක්ෂා






සම් භාණ්ඩ










AWARD CEREMONY






DIPLOMA
AWARD CEREMONY
SRI LANKA NATIONAL DESIGN INSTITUTE
Ministry of Rural Economic Affairs


# "YUGAYATA NIMAVUM" New Design Craft Exhibition - 2015 at Kandy City Centre




























# Training Programs - 2015












# 2015 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වසර සඳහා අවසාන ගිණුම්

## ජාතික මෝස්තර මධ්‍යස්ථානය

(කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය)

අංක 10, ද මැල්පාර,

කටුබැද්ද, මොරටුව

## 2015 දෙසැම්බර් මස 31 වැනි දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|---|
| | | රු | රු |
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ පිරියත හා උපකරණ | 1 | 55,586,518.19 | 48,453,597.91 |
| | | 55,586,518.19 | 48,453,597.91 |
| ජංගම වත්කම් | | | |
| අග තොගය | 2 | 5,069,118.23 | 3,343,585.09 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු | 3 | 8,239,195.17 | 7,719,427.99 |
| පෙර ගෙවුම් | 4 | 568,657.65 | 331,530.29 |
| මුදල් හා සමාන දෑ | 5 | 38,447,642.01 | 17,526,795.68 |
| | | 52,324,613.06 | 28,921,339.05 |
| මුළු වත්කම් | | 107,911,131.25 | 77,374,936.96 |
| වගකීම් | | | |
| ජංගම වගකීම් | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු | 6 | 1,388,767.30 | 952,836.80 |
| UNDP වැඩසටහනට අත්තිකාරම් වශයෙන් ලද මුදල් | 7 | 24,539,770.00 | 8,567,999.98 |
| උපචිත වියදම් | 8 | 2,660,785.29 | 2,582,102.18 |
| ජංගම නොවන බැරකම් | | 28,589,322.59 | 12,102,938.96 |
| පාරිතෝෂිත සදහා වෙන් කිරීම් | 9 | 25,666,386.88 | 20,079,606.14 |
| මුළු වගකීම් | | 54,255,709.47 | 32,182,545.10 |
| මුළු ශුද්ධ වත්කම් | | **53,655,421.78** | **45,192,391.86** |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | |
| විලම්භිත අයභාර ආදායම් | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන | | 57,010,983.24 | 46,389,643.60 |
| අඩු කළා | | | |
| ක්‍රමක්ෂය සදහා වෙන් කිරීම් පවත්නා වර්ෂය | 10 | 7,307,307.87 | 5,701,354.71 |
| | | 49,703,675.37 | 40,688,288.89 |
| අඩු කළා විලම්භිත අයභාර වියදම් කපා හැරීම | | 10,598,005.87 | 7,373,664.61 |
| | | 39,105,669.50 | 33,314,624.28 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 2,655,138.71 | 2,655,138.71 |
| සමුච්චිත අරමුදල | 11 | 11,894,613.57 | 9,222,628.69 |
| මුළු ශුද්ධ වත්කම් ස්කන්ධය | | **53,655,421.78** | **45,192,391.68** |

**මුල්‍ය ප්‍රකාශන හා මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණවීම සඳහා අවශ්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් පිටු අංක 6 සිට 21 දක්වා දැක්වේ.**

**බී ආර් රණවීර**
**ගණකාධිකාරි**

**සත්‍ය හා සාධාරණ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂවරුන් වගකීම වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්**
**2016-08-11දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අත්සන් තබන ලදී.**

| | | |
|---|---|---|
| ............................... | .................................. | .................................. |
| **මිල්හාන් ලතීෆ්** | **එම් ඒ එස් එස් කේ චන්ද්‍රසිරි** | **මොහොමඩ් ස්මයිල්** |
| **සභාපති** | **අධ්‍යක්ෂ** | **අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික** |

## ජාතික මෝස්තර මධ්‍යස්ථානය
## 2015 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යඵල ප්‍රකාශය

| | සටහන | 2015 | 2014 |
|---|---|---|---|
| | | රු | රු |
| මෙහෙයුම් ආදායම් | | | |
| භාණ්ඩාගාර ප්‍රදාන-පුනරාවර්තන | 12 | 51,466,000.00 | 45,879,600.00 |
| අමාත්‍යාංශ ප්‍රදාන ගම්මාන සංවර්ධන වැඩසටහන | | - | 12,903,266.19 |
| වෙනත් ආදායම් | 13 | 23,087,031.02 | 5,363,944.52 |
| | | 74,553,031.02 | 64,146,810.71 |
| මෙහෙයුම් වියදම් | | | |
| සේවක පඩිනඩි | 14 | 46,465,175.68 | 35,059,449.98 |
| ගමන් වියදම් | 15 | 281,173.75 | 576,494.80 |
| සැපයුම් සේවා | 16 | 766,609.15 | 1,018,103.43 |
| නඩත්තු කටයුතු | 17 | 1,275,708.57 | 1,831,084.82 |
| ගිවිසුම් ගත සේවා | 18 | 4,728,508.30 | 7,146,979.66 |
| ක්ෂය වීම් | 19 | 7,307,307.87 | 5,701,354.71 |
| පාරිතෝෂිත | | 5,586,780.74 | 3,653,765.64 |
| සම්ප්‍රදායික ගම්මාන ව්‍යාපෘති | 20 | - | 13,239,238.04 |
| වෙනත් වියදම් | 21 | 16,065,741.99 | 1,784,547.78 |
| | | 82,477,006.05 | 70,011,018.86 |
| මෙහෙයුම් කටයුතු වලින් අතිරික්තය / (ඌණතාවය) | | (7,923,975.03) | (5,864,208.15) |
| <u>එකතු කළා</u> | | | |
| ශිල්පීය හැකියා ප්‍රවර්ධනය | | 807,403.66 | 2,389,473.38 |
| සංවර්ධන ක්‍රියාකාරකම්(2502 - I,II,III ) | | 3,259,605.39 | 1,299,065.30 |
| සිහිවටන හා ත්‍යාග නිර්මාණ | | - | 1,028,767.24 |
| නව නිර්මාණ ප්‍රදර්ශනය සහ වෙනත් ප්‍රදර්ශන | | 3,936,523.83 | 2,656,358.69 |
| දින 100 වැඩසටහන යටතේ සම්ප්‍රදායික ගම්මාන සංවර්ධන වැඩසටහන | | 2,127,720.99 | - |
| අමුද්‍රව්‍ය ක්‍රියාවලි පිළිබඳ පර්යේෂණ වැඩසටහන් | | 274,510.00 | - |
| වෙබ් අඩවි නිර්මාණය | | 192,242.00 | - |
| විලම්භීත ආදායම් | | 7,307,307.87 | 5,701,354.71 |
| | | 17,905,313.74 | 13,075,019.32 |
| <u>අඩු කළා</u> | | | |
| විලම්භීත වියදම් | | 7,338,400.48 | 7,373,664.61 |
| | | 10,566,913.26 | 5,701,354.71 |
| පවත්නා වර්ෂයේ අතිරික්තය / (ඌණතාවය) | | **2,642,938.23** | **(162,853.44)** |

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

2015.12.31 දිනෙන් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2015 | | 2014 | |
|---|---|---|---|---|
| | රු | රු | රු | රු |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය** | | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් අතිරික්ත/හිගය | (7,923,975.03) | | (5,864,208.15) | |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | 44167.92 | | - | (5,864,208.15) |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | (426231) | (7,884,069.42) | - | |
| **මුදල් නොවන චලනයන්** | | | - | |
| ක්ෂය වීම් | 7,307,307.87 | | 5,701,354.71 | |
| පාරිතෝෂිත | 5,586,780.74 | | 3,653,765.64 | |
| අවසන් තොග (වැඩිවීම) / අඩුවීම | (1,725,533.14) | | (270,522.89) | |
| අඩු / (වැඩි) වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු | (519,767.18) | | (1,190,264.76) | |
| පෙර ගෙවුම් අඩුවීම් / (වැඩිවීම්) | (237,127.36) | | 58,294.77 | |
| (අඩු) / වැඩි වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු | 435,930.50 | | 445,953.30 | |
| යූ.එන්.ඩී.පී. වැඩසටහන සඳහා ලද මුදල් | 15,971,770.02 | | 7,905,235.31 | |
| පාරිතෝෂිත ගෙවීම් | - | | (450,306.00) | |
| (අඩු) / වැඩි උපචිත වියදම් | 78,683.11 | 26,898,044.56 | 1,502,119.29 | 17,355,629.37 |
| මෙහෙයුම් කටයුතු වලින් ලත් ශුද්ධ මුදල් | | 19,013,975.14 | | 11,491,421.22 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය** | | | | |
| ගොඩනැගිලි | (966,427.69) | | (1,013,393.06) | |
| යන්ත්‍ර උපකරණ | (183,350.00) | | (593,915.00) | |
| ලී බඩු හා සවි කිරීම් | (563,493.63) | | (436,496.30) | |
| කාර්යාල උපකරණ | (762,474.88) | | (388,387.16) | |
| උපකරණ හා මෙවලම් | (111,910.00) | | (11,426.00) | |
| පුස්තකාල පොත් | (294,709.95) | | (292,743.00) | |
| පරිගණක හා උපාංග | (1,314,362.00) | | (1,513,330.00) | |
| අමුද්‍රව්‍ය ක්‍රියාවලි පිළිබඳ පර්යේෂණ වැඩසටහන් | (274,510.00) | | - | |
| වෙබ් අඩවි නිර්මාණය | (192,242.00) | | - | |
| සංවර්ධන වැඩසටහන් 2502 - 11 | - | | (1,299,065.30) | |
| සිහිවටන හා ත්‍යාග භාණ්ඩ නිෂ්පාදනය | - | | (1,028,767.24) | |
| නව නිර්මාණ ප්‍රදර්ශනය හා වෙනත් ප්‍රදර්ශණ | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | (3,936,523.83) | | (2,656,358.69) | |
| ශිල්පීය හැකියා ප්‍රවර්ධනය | (807,403.66) | | (2,389,473.38) | |
| වෙනත් වත්කම් ඉවත් කිරීම | - | | 22,450.00 | |
| දින 100 වැඩසටහන යටතේ සම්ප්‍රදායික ගම්මාන සංවර්ධන වැඩසටහන . | (2,127,720.99) | | - | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් ශුද්ද මුදල් ප්‍රවාහය | | (11535128.63) | | (11,600,905.13) |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය</u> | | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන - භාණ්ඩාගාරය | 13,442,000.00 | | 12,000,000.00 | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් ශුද්ද මුදල් ප්‍රවාහය | | 13,442,000.00 | | 12,000,000.00 |
| මුදල් හා සමාන දෑ වැඩිවීම / (අඩුවීම) | | 20,920,846.51 | | 11,890,516.09 |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා සමාන දෑ | | 17,526,795.68 | | 5,636,279.68 |
| වර්ෂය අවසානයේදී මුදල් හා සමාන දෑ | | 38,447,642.01 | | 17,526,795.68 |

## 2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වසර සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| | ප්‍රග්ධන ප්‍රදාන රු | සමුච්චිත අරමුදල රු | ප්‍රත්‍යාගණන සංචිතය රු | මුලු මුදල රු |
|---|---|---|---|---|
| 2015.01.01 දිනට ශේෂය | 3,314,624.28 | 9,222,628.69 | 2,655,138.71 | 45,192,391.68 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම් | - | (4,262.31) | | (4,262.31) |
| මූලික දෝෂ | 10,858.96 | 22,450.00 | | 33,308.96 |
| විලම්භිත අයභාර වියදම් කපා හැරීම | (10,598,005.87) | 10,858.96 | | (10,587,146.91) |
| ක්‍රමක්ෂය සඳහා වෙන් කිරීම | (7,307,307.87) | | | (7,307,307.87) |
| ප්‍රත්‍යාගණන සංචිත | - | | | - |
| භාණ්ඩාගාර ප්‍රදාන - මුදල් | 13,442,000.00 | | | 13,442,000.00 |
| - වාහනය | 10,243,500.00 | | | 10,243,500.00 |
| මූල්‍ය කාර්යඵල ප්‍රකාශය | | | | |
| විදේශ මුදල් පරිවර්තන වෙනස | | | | |
| කාලච්ඡේදයේ අතිරික්තය / හිගය | - | 2,642,938.23 | - | 2,642,938.23 |
| 2015.12.31 දිනට ශේෂය | 39,105,669.50 | 11,894,613.57 | 2,655,138.71 | 53,655,421.78 |

## ජාතික මෝස්තර මධ්‍යස්ථානය

2015 වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති

**1** ගිණුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. ගිණුම් වලට බලපාන උද්ධමන සාදක සඳහා ගැලපීම යොදා නොමැති අතර මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත.

**2** රජයේ ප්‍රදානයන්

මෙම ආයතනයට ලැබෙන රජයේ ප්‍රදානයන් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වශයෙන් දෙවර්ගයක් වේ.

**3** ක්ෂයවීම්

හීනවන ශේෂ ක්‍රමය යටතේ පහත දැක්වෙන ප්‍රමාණයන් අනුව ස්ථාවර වත්කම් සඳහා ක්ෂයවිම. සඳහා වෙන් කරනු ලැබ ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 05% |
| කාර්යාල උපකරණ | 10% |
| පරිගණකභාඋපාංග | 20% |
| ලීබඩුසවිකිරීම් | 10% |
| මෙවලම්උපකරණ | 25% |
| මෝටර්වාහන | 20% |
| යන්ත්‍රෝපකරණ | 15% |
| පුස්තකාල පොත් | 05% |

**4** මූල්‍ය කාර්යඵල ප්‍රකාශය

රජයෙන් ලත් ප්‍රදානයන් සහ වෙනත් මිශ්‍ර ලැබීම් ආයතනයේ ආදායම් වශයෙන් දක්වා ඇත. සියළුම අදායම් හා වියදම් උපචිත පදනම මත පිළිගනු ලැබේ.

**5** තොග ආගණනය

තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩුම අගය මත ගණනය කර ඇත. තොග නිකුත් කිරීම පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමයට අනුව සිදුකර ඇත.

**6** ශේෂ පත්‍ර දිනට පසු සිදු වීම්

ශේෂ පත්‍ර දිනට පසු සියළුම හදුනා ගත් ප්‍රමාණාත්මක සිදුවීම් සඳහා ගැලපීම් කර ඇත.

**7** ආයතනය සතු ඉඩම් කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් ආයතනයේ නමට විධිමත්ව පැවරීමක් නොවීම නිසා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඇති ඉඩම සහ නත්තරම්පොත ව්‍යාපෘති කාර්යාලයේ ඉඩම් වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් නොවේ.

8 ආයතනය විසින් 2009 වර්ෂයේදී රු.580,000 වටිනාකම ටෙන්ඩර් ගිවිසුමක් මගින් නත්තරම්පොත උද්‍යාන අලංකාර කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් භාරදෙන ලදි. මෙම කොන්ත්‍රාත්කරු විසින් අදාල ගිවිසුමේ කොන්දේසි වලට අනුව නියමිත කාල රාමුව තුල ඉටු කල යුතු වැඩ කටයුතු නිසි ආකාරව ඉටුනොකිරීම නිසා අදාල මුදල් නොගෙවන ලදි. මේ සම්බන්ධයෙන් අදාල කොන්තාත්කරු අදාල මුදල් හා වන්දි මුදල් ඉල්ලා නඩුවක් යොමු කොට ඇත.

ආයතනය විසින් අදාල කොන්ත්‍රාත්කරු ඉටුකල වැඩ සඳහා ගෙවීම් කල යුතු යන්න ආයතනයේ මතය වන අතර එම වටිනාකම රු.502,082.56 වේ. කෙසේවෙතත් මේ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගෙන නැත.

**1.**දේපල පිරියත හා උපකරණ

| | ගොඩනැගිලි | යන්ත්‍රෝපකරණ | මෝටර් වාහන | පරිගණක | කාර්යාල උපකරණ | ලී බඩු සහ සවිකිරීම් | මෙවලම් හා උපකරණ | පුස්තකාල පොත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | රු | රු | රු | රු | රු | රු | රු | රු | රු |
| <u>පිරිවැය</u> | | | | | | | | | |
| 2015.01.01 දිනට ශේෂය | 20,492,384.61 | 5,155,326.58 | 30,044,563.07 | 9,350,175.84 | 10,579,383.20 | 5,136,979.81 | 786,448.14 | 2,266,446.49 | 83,811,707.74 |
| වර්ෂය තුල ඉවත් කිරීම් | | | | | | | | | |
| ප්‍රත්‍යාගණනය කිරීම | | | | | | | | | |
| වර්ෂය තුල මිලදී ගැනීම් | 966,427.69 | 183,350.00 | 10,243,500.00 | 1,314,362.00 | 762,474.88 | 563,493.63 | 111,910.00 | 294,709.95 | 14,440,228.15 |
| 2015.12.31 දිනට ශේෂය | 21,458,812.30 | 5,338,676.58 | 40,288,063.07 | 10,664,537.84 | 11,341,858.08 | 5,700,473.44 | 898,358.14 | 2,561,156.44 | 98,251,935.89 |
| <u>ක්ෂය වීම්</u> | | | | | | | | | |
| 2015.01.01 දිනට ශේෂය | 8,615,268.77 | 2,583,059.42 | 8,956,080.33 | 4,446,396.07 | 7,346,086.16 | 2,302,280.49 | 670,451.96 | 438,486.63 | 35,358,109.83 |
| වර්ෂය තුල ඉවත් කිරීම් | | | | | | | | | |
| වර්ෂය තුල ක්ෂය වීම් | 620,561.79 | 391,184.08 | 4,515,179.00 | 1,030,517.05 | 348,745.21 | 267,055.67 | 39,854.90 | 94,210.17 | 7,307,307.87 |
| 2015.12.31 දිනට ශේෂය | 9,235,830.56 | 2,974,243.50 | 13,471,259.33 | 5,476,913.12 | 7,694,831.37 | 2,569,336.16 | 710,306.86 | 532,696.80 | 42,665,417.70 |
| <u>පොත් අගය</u> | | | | | | | | | |
| 2015.01.01 දිනට ශේෂය | 11,877,115.84 | 2,572,267.16 | 21,088,482.74 | 4,903,779.77 | 3,233,297.04 | 2,834,699.32 | 115,996.18 | 1,827,959.86 | 48,453,597.91 |
| 2015.12.31 දිනට ශේෂය | 12,222,981.74 | 2,364,433.08 | 26,816,803.74 | 5,187,624.72 | 3,647,026.71 | 3,131,137.28 | 188,051.28 | 2,028,459.64 | 55,586,518.19 |

සටහන **02 -** අවසාන තොග

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| අමු ද්‍රව්‍ය | 224,106.96 | 237,630.39 |
| නිමි තොග | 3,850,075.84 | 2,325,480.36 |
| ලිපි ද්‍රව්‍ය | 972,710.43 | 715,294.34 |
| අමු ද්‍රව්‍ය - | - | - |
| නිමි ද්‍රව්‍ය - යූ.එන්.ඩී.පී. ව්‍යාපෘතිය | - | - |
| මෝස්තර උපදේශක සේවා තොගය | 22,225.00 | 65,180.00 |
| | 5,069,118.23 | 3,343,585.09 |

සටහන **03** වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ගිණුම්

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| අත්තිකාරම් ඉන්ධන | 200,000.00 | - |
| අත්තිකාරම් මුදලින් | 11,616.22 | 58,388.33 |
| අත්තිකාරම් චෙක්පත් | 4,000.00 | 47833.86 |
| අත්තිකාරම් තැන්පතු | - | 26241.09 |
| ලැබිය යුතු මුදල් | 63,514.75 | 94329.87 |
| <u>තැන්පතු</u> | | |
| දුරකථන තැන්පතු | 11,950.00 | 11,950.00 |
| ඉන්ධන තැන්පතු | 10,000.00 | 10,000.00 |
| පුවත් පත් තැන්පතු | 300.00 | 300.00 |
| සිලින්ඩර් තැන්පතු | 6,500.00 | 3,000.00 |
| වෙනත් තැන්පතු | 77,600.00 | 77,600.00 |
| විදුලි තැන්පතු | 20,000.00 | 20,000.00 |
| මෝස්තර අධ්‍යාපන ගිණුම | | |
| ලැබිය යුතු පංති ගාස්තු | 694,500.00 | 639,250.00 |
| අත්තිකාරම් | 48,696.16 | - |
| මෝස්තර උපදේශක සේවා ගිණුම | | |
| ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය | 450,520.00 | - |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | - | - |
| අත්තිකාරම් | 311,056.33 | 256,000.00 |
| සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | | 6,000.00 |
| ජාතික ශිල්ප සභාව | 264,720.00 | - |
| ආරක්ෂිත ඇප තැන්පතු | - | 235,000.00 |
| ගාලු උරුමය පදනම | 200,000.00 | 1,560,000.00 |
| සුභසාදන සංගමය | 50,000.00 | - |
| සේවක ණය ගිණුම | | |
| ආපදා ණය | 5,784,038.35 | 4,592,414.84 |
| උත්සව අත්තිකාරම් | 24,850.00 | 69,850.00 |
| බයිසිකල් ණය | 5,333.36 | 11,270.00 |
| | 8,239,195.17 | 7,719,427.99 |

සටහන **04 -** පෙර ගෙවුම්

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| රක්ෂණය | 397,984.73 | 273,490.14 |
| ගිවිසුම්ගත සේවා | 64,895.69 | 36,849.36 |
| බලපත්‍ර ගාස්තු | 25,777.23 | 21,190.79 |
| වරිපනම් හා බදු කුලී | 80,000.00 | - |
| | 568,657.65 | 331,530.29 |

සටහන **05 -** මුදල් හා සමාන දෑ

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| ජාතික මෝස්තර මධ්‍යස්ථාන ගිණුම - ප්‍රධාන කාර්යාලය | 2,279,694.15 | 2,958,213.46 |
| ජාතික මෝස්තර මධ්‍යස්ථාන ගිණුම නන්තරම්පොත | 84,721.35 | 59,526.46 |
| මෝස්තර උපාදේශක සේවා ගිණුම - බැංකු ශේෂය | 33,470,235.46 | 2,319,970.56 |
| - මාර්ගස්ථ මුදල් | - | 9,713,543.48 |
| මෝස්තර අධ්‍යාපන ගිණුම | 2,203,680.98 | 2,137,604.73 |
| සේවක ණය ගිණුම | 409,310.07 | 337,936.99 |
| | 38,447,642.01 | 17,526,795.68 |

සටහන **06 -** වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ගිණුම්

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 525,000.00 | 345,000.00 |
| අවිනිශ්චිත ගිණුම | 28,657.50 | - |
| තැන්පතු | 41,103.00 | 202,250.00 |
| තල් සංවර්ධන මණ්ඩලය | - | 310,006.80 |
| ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය | - | 95,580.00 |
| Oxfam ව්‍යාපෘතිය සඳහා ලද අත්තිකාරම් | 484,000.00 | - |
| තල් සංවර්ධන මණ්ඩලය | 310,006.80 | - |
| | 1,388,767.30 | 952,836.80 |
| | | |

සටහන **07 -** යූ. එන්. ඩී. පී. ව්‍යාපෘතිය සඳහා ලැබූ අත්තිකාරම් මුදල
(Special Project for Technicial Development and Market Linkage support for selected weaver producer groups in Nothern Province)

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| ලැබූ මුදල | 39,430,869.96 | 8,567,999.98 |
| වියදම් | 14,891,099.96 | - |
| ව්‍යාපෘතියේ ඉතිරි වැඩ සඳහා ඉතිරි මුදල | 24,539,770.00 | 8,567,999.98 |

සටහන **08** - උපචිත වියදම්

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| ඉන්ධන | 24,939.00 | - |
| දුරකථන | 77,962.51 | 69,623.76 |
| විදුලිය | 35,717.59 | 28,968.89 |
| පුවත් පත් | 5,790.00 | 4,110.00 |
| ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් | 403,850.50 | 330,497.50 |
| ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් | 100,962.62 | 82,624.29 |
| ජලය | 25,405.18 | 5,414.33 |
| ශිල්පීය පුහුණු | - | 24,661.92 |
| නව නිර්මාණ ප්‍රදර්ශනය | 606,666.06 | 3,200.00 |
| අතිකාල | 104,851.62 | 123,397.26 |
| ගමන් වියදම් | 9,505.75 | 40,617.00 |
| වැටුප් හා වේතන | 290,959.26 | - |
| මෝස්තර සංවර්ධන | 179,516.85 | - |
| සංග්‍රහ වියදම් | 6,035.00 | 6,612.00 |
| ප්‍රවාහන හා කුලී ගාස්තු | 27,812.90 | 28,387.10 |
| වෙනත් දීමනා | 26,459.68 | 39,209.68 |
| සම්ප්‍රසායික ගම්මාන වැඩසටහන | - | 4,395.00 |
| ගොඩනැගිලි නඩත්තු | - | 29,723.97 |
| සිහිවටන හා ත්‍යාග නිර්මාණ | - | 25,319.48 |
| වෙනත් ප්‍රදර්ශන | 106,410.81 | - |
| වාහන නඩත්තු කිරීම | 9,400.00 | - |
| පිරිසිදු කිරීමේ ගාස්තු | 2,000.00 | - |
| මෝස්තර අධ්‍යාපන ගිණුම | | |
| දේශන ගාස්තු | 4,930.00 | 75,805.00 |
| දීමනා | - | 23,000.00 |
| මෝස්තර උපදේශක ගිණුම | | |
| පාස් ඒෂියන් පුද්ගලික සමාගම | 171,000.00 | 1,634,500.00 |
| ගමන් වියදම් | - | 535.00 |

| | | |
|---|---|---|
| ලක්දිව ඉන්ශ්‍රෙවියන් | 411,030.00 | - |
| මෝස්තර සංවර්ධන වැඩසටහන වෙනුවෙන් ගෙවිය යුතු දීමනා | 29,579.96 | - |
| සේවක ණය ගිණුම | - | 1,500.00 |
| | 2,660,785.29 | 2,582,102.18 |

සටහන **09**

31.12.2015 දිනට පාරිතෝෂික වෙන් කිරීම්

| | සේවකයාගේ නම 1 | සේවයට බැඳුන දිනය | 31/12/2015 දිනට සම්පූර්ණ වසර ගණන 3 | වැටුප 4 | 5 | 31/12/2015 දිනට පාරිතෝෂික වෙන් කිරීම් (6) =(3) x (5) |
|---|---|---|---|---|---|---|
| 1 | ටී අශෝකා තිරිමාන්න | 26/09/1983 | 32 | 38,446.00 | 19,223.00 | 615,136.00 |
| 2 | එස් කේ විමලසිරි | 1985-10-06 | 30 | 40,564.00 | 20,282.00 | 608,460.00 |
| 3 | යූ එල් වික්‍රමරත්න | 1985-10-06 | 30 | 40,564.00 | 20,282.00 | 608,460.00 |
| 4 | පී ධර්මසේන | 24/06/1985 | 30 | 37,396.00 | 18,698.00 | 560,940.00 |
| 5 | එම් හෙට්ටිආරච්චි | 27/09/1985 | 30 | 47,620.00 | 23,810.00 | 714,300.00 |
| 6 | එම් එස් නාලනි | 25/10/1985 | 30 | 40,564.00 | 20,282.00 | 608,460.00 |
| 7 | ජී විතාන | 1985-01-11 | 30 | 47,562.00 | 23,781.00 | 713,430.00 |
| 8 | මානෙල් බුලත්ගම | 1985-06-12 | 30 | 47,242.00 | 23,621.00 | 708,630.00 |
| 9 | ඩී ධර්මසිරි | 1986-10-06 | 26 | 35,782.75 | 17,891.38 | 465,175.88 |
| 10 | ඩී පී ජී හේමචන්ද්‍ර | 1986-02-06 | 29 | 35,144.50 | 17,572.25 | 509,595.25 |
| 11 | කේ එල් ඒ ප්‍රේමලතා | 22/09/1986 | 29 | 38,164.00 | 19,082.00 | 553,378.00 |
| 12 | යූ ජී ජී අමරතුංග | 26/10/1986 | 29 | 36,334.00 | 18,167.00 | 526,843.00 |
| 13 | ටී එන් කරුණාරත්න | 21/111986 | 29 | 38,836.00 | 19,418.00 | 563,122.00 |
| 14 | එච් එම් ඒ යූ ශාන්ත | 1986-08-12 | 29 | 44,106.00 | 22,053.00 | 639,537.00 |
| 15 | ජී ඩබ් රම්‍යලතා | 16/03/1987 | 28 | 39,114.00 | 19,557.00 | 547,596.00 |
| 16 | අයි ආර් පියතිලක | 17/06/1987 | 28 | 38,836.00 | 19,418.00 | 543,704.00 |
| 17 | ඒ ඒ ගාමිණී | 1987-01-09 | 28 | 56,050.00 | 28,025.00 | 784,700.00 |
| 18 | ඩී ජේ පීරිස් | 1987-11-11 | 28 | 48,302.00 | 24,151.00 | 676,228.00 |
| 19 | එම් ඒ සෝමලතා | 1988-01-03 | 27 | 54,070.00 | 27,035.00 | 729,945.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 20 | ඩබ් ඒ පී කේ විජේසිංහ | 1988-01-08 | 27 | 55,390.00 | 27,695.00 | 747,765.00 |
| 21 | පාලිත පුෂ්පකුමාර | 15/04/1988 | 27 | 36,904.00 | 18,452.00 | 498,204.00 |
| 22 | ඩබ් ඒ කුලතිලක | 1988-01-06 | 27 | 36,334.00 | 18,167.00 | 490,509.00 |
| 23 | කේ පී ජේ පෙරේරා | 14/02/1989 | 26 | 36,526.00 | 18,263.00 | 474,838.00 |
| 24 | බි කේ කේ පෙරේරා | 28/06/1989 | 26 | 36,304.00 | 18,152.00 | 471,952.00 |
| 25 | මානෙල් රාජපක්ෂ | 1989-02-10 | 26 | 43,962.00 | 21,981.00 | 571,506.00 |
| 26 | යු එල් ඒ එස් කේ ජයතිස්ස | 1990-**09-06** | 25 | 36,334.00 | 18,167.00 | 454,175.00 |
| 27 | ආර් ඒ පී උදයංගනී | 20/02/1990 | 25 | 41,418.00 | 20,709.00 | 517,725.00 |
| 28 | කේ කේ එස් ද සිල්වා | 15/08/1991 | 24 | 42,250.00 | 21,125.00 | 507,000.00 |
| 29 | එම් කේ මහින්ද | 1992-01-07 | 23 | 38,794.00 | 19,397.00 | 446,131.00 |
| 30 | ජී ඒ ජී ද සිල්වා | 22/03/1993 | 22 | 36,292.00 | 18,146.00 | 399,212.00 |
| 31 | එල් ඒ කුලරත්න | 1993-05-04 | 22 | 35,018.00 | 17,509.00 | 385,198.00 |
| 32 | එච් බී ටි දමයන්ති | 1994-03-01 | 21 | 50,770.00 | 25,385.00 | 533,085.00 |
| 33 | බී කේ ඒ රුද්‍රිගු | 15/06/1994 | 21 | 35,986.00 | 17,993.00 | 377,853.00 |
| 34 | ඒ එම් ටි කේ අලගියවන්න | 1996-02-05 | 19 | 35,311.25 | 17,655.63 | 335,456.97 |
| 35 | බී මනතුංග | 1996-03-06 | 19 | 52,750.00 | 26,375.00 | 501,125.00 |
| 36 | ජේ ඒ ඒ ආර් සී ගුණරත්න | 1996-01-07 | 19 | 55,372.00 | 27,686.00 | 526,034.00 |
| 37 | ඩි එම් ඒ චන්දිමා | 15/07/1996 | 19 | 37,834.00 | 18,917.00 | 359,423.00 |
| 38 | එම් ඒ ආර් යු ගුණරත්න | 16/07/1998 | 17 | 37,108.00 | 18,554.00 | 315,418.00 |
| 39 | සුසිල් විජේතුංග | 1998-01-09 | 17 | 34,782.25 | 17,391.13 | 295,649.21 |
| 40 | ඩබ් එම් පියරත්න | 1999-04-01 | 16 | 46,372.00 | 23,186.00 | 370,976.00 |
| 41 | ආර් එම් විජිත බණ්ඩාර | 1999-01-06 | 16 | 45,496.00 | 22,748.00 | 363,968.00 |
| 42 | එස් එස් වීරසූරිය | 2000-01-02 | 15 | 36,850.00 | 18,425.00 | 276,375.00 |
| 43 | එච් ටී දිනේෂ් ද සිල්වා | 2000-01-02 | 15 | 36,995.00 | 18,497.50 | 277,462.50 |
| 44 | සී කේ කලන්සූරිය | 2000-01-02 | 15 | 37,224.00 | 18,612.00 | 279,180.00 |
| 45 | පී බී පියවතී | 2000-01-02 | 15 | 35,018.00 | 17,509.00 | 262,635.00 |
| 46 | එන් ඩී එච් මොහොට්ටි | 2000-01-02 | 15 | 33,799.00 | 16,899.50 | 253,492.50 |
| 47 | කේ රනුර කුමාර | 2000-01-02 | 15 | 34,397.00 | 17,198.50 | 257,977.50 |
| 48 | ප්‍රශාන්ත කීර්තිචන්ද්‍ර | 13/12/2000 | 15 | 41,284.00 | 20,642.00 | 309,630.00 |
| 49 | පී සී ජේ ද සිල්වා | 15/08/2005 | 10 | 43,306.00 | 21,653.00 | 216,530.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 50 | ජී සී එන් පෙරේරා | 15/08/2005 | 10 | 40,756.00 | 20,378.00 | 203,780.00 |
| 51 | වී ජී බී ඩී වීරනායක | 15/08/2005 | 10 | 39,100.00 | 19,550.00 | 195,500.00 |
| 52 | එස් ඩබ් විජිතානි | 25/10/2005 | 10 | 39,100.00 | 19,550.00 | 195,500.00 |
| 53 | බී ආර් රණවීර | 15/02/2006 | 9 | 49,366.00 | 24,683.00 | 222,147.00 |
| 54 | ආර් එම් ගාමිණී රත්නායක | 2007-12-12 | 8 | 33,235.50 | 16,617.75 | 132,942.00 |
| 55 | ජේ අනිල් විජේසූරිය | 2008-01-01 | 8 | 33,235.50 | 16,617.75 | 132,942.00 |
| 56 | අයි ඒ ක්ලීටස් අසංග | 15/02/2008 | 7 | 34,851.25 | 17,425.63 | 121,979.41 |
| 57 | එම් ටී ටී ජයවර්ධන | 15/02/2008 | 7 | 34,517.75 | 17,258.88 | 120,812.16 |
| 58 | ටී සී විජේරත්න | 2008-03-03 | 7 | 41,226.00 | 20,613.00 | 144,291.00 |
| 59 | එම් ඒ ඩී පී කිත්සිරි | 15/07/2008 | 7 | 34,517.75 | 17,258.88 | 120,812.16 |
| 60 | එම් ටී ආර් ප්‍රනාන්දු | 2008-01-09 | 7 | 33,235.00 | 16,617.75 | 116,324.25 |
| 61 | එන් ජී කේ ඉන්දික | 2009-06-08 | 6 | 35,313.00 | 17,756.50 | **105, 939.00** |
| 62 | ඩබ් එල් එස් එස් රත්නායක | 2009-11-04 | 6 | 33,097.50 | 16,548.75 | 99,292.50 |
| | | | | | | 25,666,987.29 |
| | අඩු කළා<br>පාරිතෝෂිත ගෙවීම්<br>මුළු පාරිතෝෂිත | | | | | - |
| * | ඩී ධර්මසිරි වැටුප් රහිත නිවාඩු | වසර 3 | | | | 25,666,386.88 |

| සටහන **10** - ක්‍රමක්ෂය | | |
|---|---|---|
| විලම්භිත අයභාර ආදායම් | 2015.12.31 | 2014.12.31 |
| ප්‍රාග්ධන ප්‍රදාන | රු | රු |
| පෙර වර්ෂය | 33,325,483.24 | 26,239,643.60 |
| පවත්නා වර්ෂය | 23,685,500.00 | 20,150,000.00 |
| | 57,010,983.24 | 46,389,643.60 |
| අඩු කළා | | |
| ශිල්පීය හැකියා ප්‍රවර්ධනය සඳහා ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන | 807,403.66 | 2,389,473.60 |
| දින 100 වැඩසටහන යටතේ සම්ප්‍රදායික ගම්මාන සංවර්ධන වැඩසටහන | 2,127,720.99 | - |
| සංවර්ධන ක්‍රියාකාරකම් 2502 - 11 | 3,259,605.39 | 1,299,065.30 |

| | | |
|---|---|---|
| සිහිවටන හා ත්‍යාග භාණ්ඩ නිෂ්පාදනය | - | 1,028,767.24 |
| නව නිර්මාණ ප්‍රදර්ශනය | 3,936,523.83 | 2,656,358.69 |
| අමුද්‍රව්‍ය ක්‍රියාවලි පිළිබඳ පර්යේෂණ වැඩසටහන් | 274,510.00 | - |
| වෙබ් අඩවි නිර්මාණය | 192,242.00 | - |
| | 10,598,005.87 | 3,688,538.90 |
| - | 46,412,977.37 | 39,015,978.99 |
| <u>අඩු කළා</u> | | |
| ක්‍රමක්ෂය | 7,307,307.87 | 5,701,354.71 |
| විලම්භිත අයභාර ආදායම් | 39,105,669.50 | 33,314,624.28 |

භාණ්ඩාගාරයේන් ලද ප්‍රාග්ධන ප්‍රධාන ශේෂ පත්‍රයේ විලම්භිත ආදායම් ලෙස දක්වා 2015 වර්ෂයේ වාර්ෂික ක්ෂය ප්‍රමාණය මත ක්‍රමක්ෂය වෙන් කිරීම් කර ඇත

සටහන **11** සමුච්චිත අරමුදල

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| වර්ෂය මුල ශේෂය | 9,222,628.69 | 9,385,482.13 |
| (+) පෙර වර්ෂ වල ගැලපීම් | 33,308.96 | - |
| (-) පෙර වර්ෂ වල ගැලපීම් | (4,262.31) | - |
| | 9,251,675.34 | 9,385,482.13 |
| වර්ෂයේ අතිරික්තය / (ඌනතාවය) | 2,642,938.23 | (162,853.44) |
| | 11,894,613.57 | 9,222,628.69 |

<u>සටහන 12</u>

<u>භාණ්ඩාගාර ප්‍රදාන</u>

| | 2015 | 2014 |
|---|---|---|
| | රු | රු |
| ජනවාරි | 3,000,000.00 | 3,700,000.00 |
| පෙබරවාරි | 4,563,000.00 | 3,495,000.00 |
| මාර්තු | 4,300,000.00 | 3,635,000.00 |
| අප්‍රේල් | 4,330,000.00 | 3,500,000.00 |
| මැයි | 4,315,000.00 | 3,300,000.00 |
| ජුනි | 3,750,000.00 | 3,500,000.00 |
| ජූලි | 4,344,000.00 | 3,700,000.00 |
| අගෝස්තු | 4,500,000.00 | 3,945,000.00 |

| | | |
|---|---|---|
| සැප්තැම්බර් | 4,543,000.00 | 3,800,000.00 |
| ඔක්තොබර් | 4,465,000.00 | 3,727,000.00 |
| නොවැම්බර් | 4,428,000.00 | 4,137,000.00 |
| දෙසැම්බර් | 4,928,000.00 | 5,440,600.00 |
| | 51,466,000.00 | 45,879,600.00 |

භාණ්ඩාගාර ප්‍රදාන

| | 2015 | 2014 |
|---|---|---|
| | රු | රු |
| භාණ්ඩාගාර ප්‍රදාන - මුදල් | 13,442,000.00 | 12,000,000.00 |
| භාණ්ඩාගාර ප්‍රදාන - වාහන | 10,243,500.00 | 8,150,000.00 |
| | 23,685,500.00 | 20,150,000.00 |

සටහන13

වෙනත් ආදායම්

| | සටහන | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|---|
| | | රු | රු |
| පුහුණු පාඨමාලා ආදායම් | | 69,694.45 | 124,113.00 |
| පෞද්ගලික වාහන භාවිතය | | 5,652.68 | 8,800.00 |
| වැටුප් රහිත නිවාඩු | | 40,922.92 | 66,492.97 |
| ලද රක්ෂණ වන්දි | | (35,491.91) | (31,881.01) |
| විවිධ ආදායම් | | 518,863.68 | 425,899.24 |
| ලාභ අලාභ ගිණුම ( අනු අංක 01) | 13.1 | 464,797.16 | 182,566.89 |
| රාජ්‍ය භාගය | | - | 6,600.00 |
| මෝස්තර අධ්‍යාපන ගිණුම | | | |
| මෝස්තර පාඨමාලා ලියාපදිංචි ගාස්තු 2014-2015 | | 980,000.00 | 2,130,000.00 |
| මෝස්තර පාඨමාලා ගාස්තු 2013-2014 | | - | 510,000.00 |
| අයදුම්පත්‍ර ගාස්තු | | 48,000.00 | 23,000.00 |
| උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා ගාස්තු | | 498,000.00 | - |
| සහතික පත්‍ර ප්‍රධානෝත්සව ගාස්තු | | 102,500.00 | - |
| මෝස්තර උපදේශන ගිණුම | | | |
| මෝස්තර උපදේශන සේවා ආදායම් | | 420,690.00 | 1,016,247.32 |
| ලක්සල ව්‍යාපෘතිය | | 16,573.29 | 81,231.86 |
| යූ. එන්. ඩී. පී. ආදායම් | | 14,891,099.96 | - |
| ඔක්සෆැම් ආදායම් | | 4,794,868.00 | - |
| විවිධ ආදායම් | | 21,250.00 | 257,705.00 |
| ආරම්භක තොගය භාණ්ඩ සමීක්ෂණ 2014 | | - | 30,955.34 |
| පුහුණු පාඨමාලා වලින් ලද උපදේශක ආදායම් | | - | 339,813.80 |
| පුහුණු පාඨමාලා වලින් ලද වෙනත් ආදායම් | | 35,651.00 | - |
| සේවක ණය ගිණුම | | | |
| පොළී ආදායම් | | 213,959.79 | 192,400.11 |
| | | 23,087,031.02 | 5,363,944.52 |

අනුසටහන 13.1

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

2015-12-31 දිනෙන් අවසන් වසර සඳහා ලාභාලාභ ගිණුම

| | සටහන | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|---|
| | | රු | රු |
| ආදායම් (විකුණුම්) | | 2,249,068.94 | 381,986.26 |
| විකුණු බඩුවල පිරිවැය (සටහන 13-1-1) | 13-1-1 | 1,714,284.68 | 209,266.37 |
| දල ලාභය | | 534,784.26 | 172,719.89 |
| අඩු කළා - ප්‍රයෝජනයට ගත නොහැකි නිමි තොග | | (84,553.60) | - |
| එකතු කළා - පොදු පහසුකම් මධ්‍යස්ථානයේ ආදායම් | | 14,566.50 | 9,847.00 |
| මුළු ලාභය | | 464,797.16 | 182,566.89 |

අනු සටයන 13-1-1

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| <u>අමු ද්‍රව්‍ය</u> | රු | රු |
| ආරම්භක තොගය (2015-01-01) | 237,630.39 | 165,510.03 |
| ගැනුම් | 618,241.26 | 317,941.01 |
| | 855,871.65 | 483,451.04 |
| <u>අඩු කළා</u> | | |
| අවසන් තොගය (2015-12-31) | 224,106.96 | 237,630.39 |
| පරිභෝජනය කළ අමු ද්‍රව්‍ය පිරිවැය | 631,764.69 | 245,820.65 |
| <u>නිමි ද්‍රව්‍ය</u> | | |
| ආරම්භක තොගය (2015-01-01) | 2,325,480.36 | 2,288,926.08 |
| | 2,957,245.05 | 2,534,746.73 |
| ගැනුම් | 2,691,669.07 | - |
| | 5,648,914.12 | 2,534,746.73 |
| <u>අඩු කළා</u> | | |
| අවසන් තොගය (2015-12-31) | 3,934,629.44 | 2,325,480.36 |
| විකුණු බඩුවල පිරිවැය | 1,714,284.68 | 209,266.37 |

සටහන 14

පෞද්ගලික පඩිනඩි

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| වැටුප් හා වේතන | 39,308,838.93 | 29,266,354.54 |
| සේවක අර්ථසාධක අරමුදල් | 4,680,600.43 | 3,437,776.55 |
| සේවක භාරකාර අරමුදල් | 1,169,696.11 | 859,444.22 |
| අතිකාල | 919,147.37 | 1,083,734.18 |
| වෙනත් දීමනා | 386,892.84 | 412,140.49 |
| | 46,465,175.68 | 35,059,449.98 |

**සටහන 15**

ගමන් වියදම්

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| දේශීය | 281,173.75 | 438,511.80 |
| විදේශීය | - | 137,983.00 |
| | 281,173.75 | 576,494.80 |

**සටහන 16**

සැපයුම්

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 185,651.46 | 539,973.43 |
| ඉන්ධන | 489,957.69 | 390,667.00 |
| නිල ඇඳුම් | 88,000.00 | 86,470.00 |
| වෛද්‍ය | 3,000.00 | 993.00 |
| | 766,609.15 | 1,018,103.43 |

සටහන **17**

නඩත්තු කටයුතු

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| වාහන නඩත්තු | 876,289.79 | 1,155,138.98 |
| ගොඩනැගිලි නඩත්තු | 136,009.50 | 443,010.30 |
| යන්ත්‍ර හා උපකරණ | 28,581.00 | 36,404.00 |
| කාර්යාල උපකරණ | 234,828.28 | 196,531.54 |
| | 1,275,708.57 | 1,831,084.82 |

සටහන **18**

ගිවිසුම්ගත සේවා

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| ප්‍රවාහන හා කුලී ගාස්තු | 640,842.15 | 683,309.60 |
| දුරකථන ගාස්තු | 591,932.55 | 601,313.40 |
| තැපැල් | 31,151.00 | 39,023.00 |
| විදුලිය හා ජලය | 982,470.34 | 1,015,412.11 |
| බදුකුලී හා වරිපනම් | 88,371.68 | 63,767.26 |
| වෙනත් ප්‍රදර්ශන වියදම් | - | 410,153.03 |
| මීයන් මර්ධනය කිරීම් | 350.00 | 36,560.00 |
| අලෙවි ප්‍රවර්ධන | 11,075.00 | 7,695.00 |
| ප්‍රජා සංචාරක ගම්මාන වැඩසටහන | - | 33,795.00 |
| UNDP වැඩසටහන අදියර II | - | 303,758.93 |
| සේවක පුහුණු වැඩසටහන් | 3,600.00 | 70,407.00 |
| විගණන ගාස්තු | 180,000.00 | 578,538.50 |
| නීතිඥ ගාස්තු | - | 31,000.00 |
| පවිත්‍රතා | 129,163.84 | 99,964.20 |
| ප්‍රචාරනය | - | 391,829.20 |
| සුළු මුදල් විවිධ වියදම් | 247,237.90 | 118,370.50 |
| බැංකු ගාස්තු | 17,190.00 | 16,115.00 |
| පුවත් පත් | 49,785.00 | 40,855.00 |

| | | |
|---|---|---|
| සේවා ගිවිසුම් | 81,334.71 | 56,115.32 |
| රක්ෂණය | 544,941.21 | 568,547.87 |
| වාහන බලපත්‍ර | 70,698.56 | 92,373.31 |
| වාර්ෂික වාර්තා මුද්‍රණය | 139,953.50 | 35,062.00 |
| සාකච්ඡා හා සංග්‍රහ | 323,769.95 | 408,692.20 |
| ඉන්ධන දීමනා | 360,410.40 | 781,153.00 |
| අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් දීමනා | 18,000.00 | 18,000.00 |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 20,000.00 | 169,000.00 |
| විගණන හා කළමණාකරන කමිටු දීමනා | 16,400.00 | 98,000.00 |
| සම්මුඛ පරික්ෂණ | - | 28,412.00 |
| දැයට කිරුළ පුහුණු වැඩසටහන් හා ප්‍රදර්ශනය | - | 174,254.52 |
| වෙබ් අඩවි නඩත්තු ගාස්තු | 13,000.00 | - |
| භාණ්ඩ සමීක්ෂණ වියදම් | 166,830.51 | 152,952.71 |
| වෙනත් මූල්‍ය වත්කම් ඉවත් කිරීමේ ගිණුම | - | 22,450.00 |
| | 4,728,508.30 | 7,146,979.66 |

සටහන 19

**ක්ෂයවීම්**

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| ගොඩනැගිලි | 620,561.79 | 571,774.89 |
| යන්ත්‍ර උපකරණ | 391,184.08 | 349,120.97 |
| කාර්යාල උපකරණ | 348,745.21 | 316,101.10 |
| ලී බඩු සවිකිරීම් | 267,055.67 | 266,467.00 |
| මෙවලම් | 39,854.90 | 34,856.73 |
| පුස්තකාල පොත් | 94,210.17 | 80,800.89 |
| පරිගණක | 1,030,517.05 | 847,612.44 |
| වාහන | 4,515,179.00 | 3,234,620.69 |
| | 7,307,307.87 | 5,701,354.71 |

සටහන 20

**සම්ප්‍රදායික ගම්මාන සංවර්ධන වැඩසටහන**

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| ගම්මාන සංවර්ධන වැඩසටහන - රතුමැටි | - | 5,780,486.27 |
| ගම්මාන සංවර්ධන වැඩසටහන - THVP | - | 4,142,984.27 |
| ගම්මාන සංවර්ධන වැඩසටහන - IDB | - | 495,955.91 |
| ගම්මාන සංවර්ධන වැඩසටහන - NCC | - | 443,992.53 |
| ගම්මාන සංවර්ධන වැඩසටහන - WEP | - | 1,344,787.11 |
| හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන | - | 1,031,031.95 |
| | - | 13,239,238.04 |

සටහන 21

**වෙනත් වියදම්**

| | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|
| | රු | රු |
| මෝස්තර අධ්‍යාපන ගිණුම | | |
| අධ්‍යාපන ක්‍රියාකාරකම් | 1,349,691.00 | 1,084,511.64 |
| වෙනත් | 14,911.59 | 3,000.00 |
| මෝස්තර උපදේශණ ගිණුම | | |
| UNDP ව්‍යාපෘතිය | 10,191,415.52 | - |
| දිවි නැගුම වැඩසටහන් වියදම් | 4,413,344.39 | - |
| වෙනත් වියදම් | 88,479.65 | 233,427.88 |
| බොල් ණය | 6,000.00 | 385,592.00 |
| ජාතික මෝස්තර මධ්‍යස්ථානය | | |
| රසායන ද්‍රව්‍ය | - | 47,074.52 |
| සේවක ණය ගිණුම | - | - |
| බොල් ණය | 1,899.84 | 30,941.83 |
| | 16,065,741.99 | 1,784,547.87 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීසීඑම්/ඒ/එන්ඩීසී/1/01/2015/එප්ප්

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 මාර්තු 13 දින

සභාපති,

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

**ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධිත පනතේ 84(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මධ්‍යස්ථානයේ සභාපති වෙත 2017 පෙබරවාරි 13 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2015 දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම අනුව කාර්යාල උපකරණ ගිණුමේ ශේෂය රු.11,411,858 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.11,341,858 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.70,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන අනුව වත්කම් ගිණුම් 06 ක එකතු වටිනාකම රු.76,793,123 ක් වුවද, 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව එම වත්කම්වල එකතු වටිනාකම රු.58,391,226 ක් වූයෙන් රු.18,401,897 ක වෙනසක් පැවතුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන අනුව වත්කම් ගිණුම් 02 ක එකතු වටිනාකම රු.17,561,657 කට අදාළව ස්ථාවර වත්කම් ලේඛන සහ ප්‍රධාන කාර්යාලය සහ නත්තරම්පොත ව්‍යාපෘති කාර්යාලය පිහිටි ඉඩම් සඳහා රජයේ ගැසට් නිවේදන හෝ ඉඩම් ඔප්පු විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලදී.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1982 අංක 35 දරන ජාතික මෝස්තර මධ්‍යස්ථානය පිහිටුවීමේ පනත | ආයතනය පිහිටුවීමේ පනත අනුව ආයතනයේ පරමාර්ථවලට පටහැනිව වෙනත් ආයතනයක් වෙතින් චිත්‍ර හා මූර්ති සැපයීම සඳහා කොන්ත්‍රාත්තුවක් ලබා ගෙන අදාළ කොන්ත්‍රාත්තුව උප කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දී තිබුණි. |
| (ආ) ආයතන සංග්‍රහයේ ii වන පරිච්ඡේදයේ 13 වන ඡේදයේ 13.3 දරන වගන්තිය | වැඩ බැලීමේ පත්වීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස පමණක් වන අතර අදාළ තනතුරට පූර්ණකාලීනව නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්වීමක් නොපමාව කළ යුතුය. තවද පුරප්පාඩුවී තිබෙන තනතුරකට වැඩබැලීම සඳහා පත් කළ යුත්තේ එම තනතුර දැරීමට සෑම අතින්ම පූර්ණ සුදුසුකම් ලත් නිලධාරියකු වුවද, අධ්‍යක්ෂ (අලෙවි/තොරතුරු) තනතුරෙහි වැඩ බැලීම සඳහා 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වැඩබැලීමේ දීමනා ගෙවීමකින් තොරව ආයතනයේ සහකාර ගණකාධිකාරීවරයා පත්කර තිබුණි. |

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 371 (2) | තත්කාර්යය අත්තිකාරම් එය දෙන ලද කාර්ය නිම කළ විගසම පියවිය යුතු වුවත්, 2015 සැප්තැම්බර් 09 දින මෝස්තර උපදේශක අරමුදල මගින් ලබා දී තිබූ රු.15,600 ක අත්තිකාරම් 2016 ඔක්තෝබර් 31 දින දක්වාම පියවීමට කටයුතු කර නොතිබුණු අතර අවස්ථා 33 කදී ලබාදුන් එකතුව රු.371,105 ක අත්තිකාරම් මාස 01 සිට මාස 04 දක්වා ප්‍රමාද වී පියවීම් කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 760 | සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව එකතුව රු.56,975 ක තොග ඌනතාවයක් පැවතියද එම ඌනතාවය පිළිබඳ සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. |

(ඇ) 2006 ජනවාරි 25 දින හා ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍ය ආයතන චක්‍රලේඛ අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | |
|---|---|
| (i) 5.4.4 (1) වගන්තිය | ජාතික මෝස්තර මධ්‍යස්ථානය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේදී කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිම අත්තිකාරමක් ගෙවිය හැකි වුවත්, සියයට 50 ක් වූ රු.79,420 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. |
| (ii) 8.9.1 (අ) වගන්තිය | වටිනාකම රු.250,000 ඉක්මවන කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කල යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (iii) 2.7.5 වගන්තිය | අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) 2014 පෙබරවාරි 17 දින හා අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 (අ) ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාළව යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,642,938 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.162,853 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,805,791 ක වර්ධනයක් විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වෙනත් වියදම් රු.14,281,194 කින් වර්ධනය වී තිබුණද වෙනත් ආදායම් රු.17,723,087 කින් වර්ධනය වීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011, 2012 සහ 2014 වර්ෂවල මූල්‍ය ඌනතාවයක් පැවති අතර, 2013 සහ 2015 වර්ෂවල අතිරික්තයක් ඇති වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී මෝස්තර මධ්‍යස්ථානයේ දායකත්වය 2011 වර්ෂයේදී රු.28,032,782 ක් වූ අතර, එය ක්‍රමයෙන් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.56,415,422 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මධ්‍යස්ථානයේ 2014 වර්ෂයේ 2.38 ක්ව පැවති ජංගම අනුපාතය, සමාලෝචිත වර්ෂය වන විට 1.83 දක්වා අඩුවී තිබුණි. මෙම තත්වයට සමාලෝචිත වර්ෂයේදී යූ.එන්.ඩී.පී ව්‍යාපෘතිය මඟින් වූ බැරකම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 186 කින් ඉහල යාම හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යය සාධනය

1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනත යටතේ පිහිටවූ ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ බලතල හා කාර්යයන් එකී පනතේ 82 වන වගන්තිය ප්‍රකාරව පහත දැක්වේ.

- කුඩා කර්මාන්ත සඳහා මෝස්තර සම්පාදනය,
- මෝස්තර හා භාණ්ඩ නිෂ්පාදන අමුද්‍රව්‍ය සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම,
- හස්ත කර්මාන්ත භාණ්ඩ සඳහා දේශීය හා විදේශීය වෙළඳපල සංවර්ධනය කිරීම,
- කාර්යක්ෂමව හස්ත කර්මාන්ත නිෂ්පාදනය කිරීමට ක්‍රියා කිරීම,
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට හා ශිල්පීන්ට හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය හා සංවර්ධනය සඳහා උපදෙස් දීම හා සහාය වීම,
- අමුද්‍රව්‍ය සඳහා ප්‍රමිති සහතික නිකුත් කිරීම,
- තොරතුරු බැංකුවක් පවත්වාගෙන යාම,
- සපයන සේවා සඳහා ගාස්තු අය කිරීම සහ සමාන ආයතන සමඟ එකඟවීම් වලට එළඹීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයේ 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ කාර්යයන් අතර, ජාතික ප්‍රදර්ශනාගාරය හරහා නව මෝස්තර ජනතාව අතර ප්‍රකට කිරීම සහ ජාතික ප්‍රදර්ශනාගාරය හරහා නව මෝස්තර අලෙවිකරණය දක්වා තිබුණි. එම කාර්යය සාධන දර්ශක ලෙස, ප්‍රදර්ශනාගාරයේ ප්‍රදර්ශනය කල ශිල්ප නිර්මාණ, නැරඹූ ප්‍රේක්ෂකයන් සහ ප්‍රදර්ශනාගාරයේ විකුණුම් ආදායම සටහන් කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය තුල මෙම ඉලක්ක කිසිවක් ලඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නිෂ්පාදන ද්‍රව්‍යවල තත්ත්වය හා ප්‍රමිතිය සම්බන්ධයෙන් නියම කරන ලද සහතික නිකුත් කිරීම සහ මෝස්තර, වෙළඳපොල ප්‍රවණතා ගැන තොරතුරු බැංකුවක් පවත්වාගෙන යාම යන කාර්යන් ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2015 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී සැලැස්ම සමඟ කාර්යය සාධන වාර්තාව සැසඳීමේදී වර්ෂය තුළදී එක් එක් අරමුණු යටතේ වූ ඉලක්ක සපුරා නොගත් අවස්ථා 02 ක් නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේදී රජයේ දින 100 වැඩසටහනට සමගාමීව සම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන 08 ක් සංවර්ධනය කිරීමට සැලසුම් සකස් කලද, දින සියය අවසාන වනවිට වැඩසටහන් 04 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී අලෙවි වටිනාකම රු.7,000,000 ක්වූ නිර්මාණ වෙළඳපලට හඳුන්වා දීමට ඉලක්ක කලද, වර්ෂය අවසාන වන විට රු.2,800,000 ක අලෙවි වටිනාකමක් ඇති නව නිර්මාණ පමණක් වෙළඳපොළට හඳුන්වා දී තිබුණි.

(ඇ) මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයක් වන මෝස්තර නිර්මාණය 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළදී වාර්ෂිකව වර්ධනයවී තිබුණද, 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 4.88 කින් එනම් 43 කින් අඩුවී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 4.2.2 වගන්තිය අනුව රාජ්‍ය ආයතනවල කාර්ය සාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කල මෙහෙයවීම හා සමාලෝචනය කල යුතු වුවත්, මධ්‍යස්ථානය 2015 වර්ෂය තුළදී එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

### 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

මධ්‍යස්ථානයේ අනුමත කාර්ය මණ්ඩලය 109 දෙනෙකු වූ අතර, තත්‍ය කාර්ය මණ්ඩලය 86 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩලයේ 23 දෙනෙකුගේ ඌනතාවයක් පැවතුණි. මෙම කාර්ය මණ්ඩල ඌනතාවය නිසා වැඩ බෙදීම සහ අභ්‍යන්තර පාලනය යන කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීමේ ප්‍රමාදයන් පැවතුණි. තවද ආයතනයේ ස්ථිර තනතුරු තුනක් සඳහා 2015 වර්ෂය තුළදී ස්ථිර සේවකයින් බඳවා ගැනීමකින් තොරව, කොන්ත්‍රාත් පදනමට බඳවාගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2015 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන මාස 05 ක ප්‍රමාදයකින් පසු 2016 අගෝස්තු 29 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

ආයතනයේ අභ්‍යන්තර විගණක තනතුර සඳහා වැඩ ආවරණ පදනම මත එක් නිලධාරිනියක් පමණක් පත්කර ඇති අතර, එම තනතුර සඳහා ස්ථිර සේවකයෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

5.3 විගණන කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය අනුව, අවම වශයෙන් මාස තුනකට වරක් විගණන කමිටු පැවැත්විය යුතු වුවත් ජාතික මෝස්තර මධ්‍යස්ථානය 2015 වර්ෂයේ විගණන කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි.

5.5 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත වියදම්, තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී වැය විෂයයන් 16 කට අදාළව සියයට 25 සිට සියයට 100 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත අවසාන විගණිත ගිණුම් සමඟ විගණන වාර්තා භාෂාත්‍රයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත්, 2012 වාර්ෂික වාර්තාව සභාගත කිරීමට 2015 නොවැම්බර් 09 දින දක්වා ප්‍රමාද කර තිබූ අතර, 2013 සහ 2014 වර්ෂවල වාර්ෂික වාර්තා 2016 සැප්තැම්බර් 30 දින දක්වා සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මධ්‍යස්ථානයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කල යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් නොකිරීම, බැංකු සැසඳුම් සකස් කිරීමේදී නිරවුල් නොකල ශේෂ පැවතීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | වත්කම් ලේඛන යාවත්කාලීනව නඩත්තු නොකිරීම, සමීක්ෂණ මණ්ඩල පත් කිරීම හා සමීක්ෂණ සිදු කිරීම ප්‍රමාද කර සිදු කිරීම. |
| (ඇ) ගබඩා පාලනය | ගබඩා ද්‍රව්‍ය සහ ප්‍රදර්ශන අලෙවි ඉතිරි තොග යාවත්කාලීනව ලේඛනගත නොකිරීම. |
| (ඈ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර පාලන ක්‍රම හා අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් නොකිරීම, අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීමට පියවර නොගැනීම. |
| (ඉ) කාර්ය මණ්ඩල කළමනාකරණය | ස්ථිර තනතුරු සඳහා දීර්ඝ කාලයක සිට කොන්ත්‍රාත් සේවකයන් සේවයේ යෙදවීම, ස්ථිර තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවා නොගැනීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති